# ජීව විද්‍යාව

# BIOLOGY

## Advanced Level

## උසස් පෙළ

විෂය නිර්දේශය සම්පූර්ණයෙන්ම ආවරණය කරන

## 1985 - 2018

පසුගිය විභාග ප්‍රශ්න

Classified
**MCQ**

වර්ගීකරණය කළ
**බහුවරණ**

**Book 02**

3 ඒකකය

පරිණාමය හා ජීවීන්ගේ විවිධත්වය

pesuru
Prakashana Private Ltd.

උසස් පෙළ

# ජීව විද්‍යාව

වර්ගීකරණය කළ
බහුවරණ ප්‍රශ්න
**1985-2018**

**3 ඒකකය – පරිණාමය හා ජීවීන්ගේ විවිධත්වය**

ප්‍රකාශනය
**සී/ස පේසුරු ප්‍රකාශන (පුද්)**
330 ඩී, දේවමිත්ත පෙදෙස
හෙයියන්තුඩුව.

Tel : 0112487218
E-mail :pesuru@gmail.com
Web :www.pesuru.com

# පෙරවදන

මෙම වර්ගීකරණය කරන ලද ජීව විද්‍යාව බහුවරණ ප්‍රශ්න පොත් පෙළ සකස් කිරීමේ දී 1985 සිට 2000 දක්වා සත්ත්ව විද්‍යාව සහ උද්භිද විද්‍යාව යනුවෙන් වෙන් වෙන්ව ඉගැන්වූ විෂයන් දෙකෙහි ප්‍රශ්න පත්‍ර සහ 2000 න් පසුව මේ දක්වා උගන්වන ජීව විද්‍යාව ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න අතුරින් අවසාන වශයෙන් අනුමත ජීව විද්‍යාව විෂය නිර්දේශයට අනුව ඒ ඒ පාඩම්වලට අදාළ ප්‍රශ්න පමණක් තෝරාගෙන ඇතුළත් කොට ඇත.

2010 දක්වා ප්‍රශ්න පත්‍රවල බහුවරණ ප්‍රශ්න 60 ක්ද 2011 සිට බහුවරණ ප්‍රශ්න 50 ක් ද බහුවරණ ප්‍රශ්න පත්‍රයට ඇතුලත් වේ.

මෙම ප්‍රශ්න පත්‍ර අතුරින් 2000 දක්වා උද්භිද විද්‍යාව ප්‍රශ්න පත්‍රවල ද 2000 ට පසුව ජීව විද්‍යාව විද්‍යාව ප්‍රශ්න පත්‍රවල ද ප්‍රශ්නය සමග A, B, C, D, E යනුවෙන් පිළිතුරු 5 ක් ලබා දී ඇත. එම ප්‍රශ්න, ප්‍රශ්න පත්‍රයේ යෙදෙන අවස්ථාවේ දී උපදෙස් සම්පිණ්ඩනයක් ලබා දී ඇත. ඒ උපදෙස් සම්පිණ්ඩනය අනුව නිවැරදි පිළිතුර තෝරා ගත යුතුය.

මෙම වර්ගීකරණ අභ්‍යාසවලට අනුව ඒ ඒ වර්ෂවල අනුපිළිවෙලට ප්‍රශ්න පාඩම් අනුව වර්ග කර ඇති බැවින් ඒ ඒ ආකෘතිවලට අදාළ ප්‍රශ්න එක තැනකට ගෙන ඒමෙන් අදාළ වසර හෝ අදාළ පාඩම පිළිබඳ අනුපිළිවෙල වෙනස්විය හැකි බැවින් අදාළ පාඩමට අනුව අදාළ වර්ෂයේ ප්‍රශ්න යෙදුණු අනුපිළිවෙල අනුවම මෙහි ප්‍රශ්න අන්තර්ගත කොට ඇත.

**උපදෙස් සම්පිණ්ඩනය**

| (1) | (2) | (3) | (4) | (5) |
|---|---|---|---|---|
| (A), (B), (D) නිවැරදියි | (A), (C), (D) නිවැරදියි | (A), (B) නිවැරදියි | (C), (D) නිවැරදියි | වෙනත් ප්‍රතිචාර හෝ සංයෝජනයක් හෝ නිවැරදියි |

# 3 ඒකකය – පරිණාමය හා ජීවීන්ගේ විවිධත්වය

**නිපුණතාව 3. 1. 0 : ජීවයේ පරිණාමය ගවේෂණය**
**නිපුණතා මට්ටම 3. 1. 1 : පරිණාමය විස්තර කරන වාදයන්**

(1) වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ස්වයංසිද්ධව ස්වාභාවික සිද්ධීන් නිසා ජීවීන්ගේ ප්‍රවේණි ද්‍රව්‍යවල ආවේණික විය හැකි වෙනස්කම් ඇති වේ.
(2) විකෘතිය, අවතරණය හා ප්‍රතිසංයෝජනය ජීවී විශේෂයක ප්‍රවේණි ප්‍රභේදනය වැඩි කරන ප්‍රවේණි ක්‍රියාවලියන් ය.
(3) ස්වාභාවික වරණය ක්‍රියාත්මක වීමට ප්‍රවේණි ප්‍රභේදනය අත්‍යවශ්‍ය වේ.
(4) ද්විලිංගිකත්වය ප්‍රවේණි ප්‍රභේදනය වැඩි වීමට හේතු වන අතර ඒක ලිංගිකත්වය ප්‍රවේණි ප්‍රභේදනය අඩු වීමට හේතු වේ.
(5) ඌනනය, ජීවී විශේෂයක ගෙනෝමයේ ප්‍රමාණය නියතව තබාගැනීමට ඉවහල් වේ. (1991 B)

(2) ඩාවින් විසින් යෝජනා කරන ලද පරිණාමවාදයෙහි ප්‍රධාන දුර්වලකමක් වූයේ,
(1) එය ජීවය ආරම්භ වූ හැටි පැහැදිලි නොකිරීමයි.
(2) ආවේණික ක්‍රියාවලිය වැරදි ලෙස විස්තර කිරීමයි.
(3) DNA ගැන සඳහන් නොකිරීමයි.
(4) මානව පරිණාමය පිළිබඳ විස්තර නිරවද්‍ය නොවීමයි.
(5) වංශ ප්‍රවේණිය ගැන පැහැදිලි කිරීමක් නොතිබීමයි. (1989 Z)

(3) පහත සඳහන් වගන්ති අතුරින් පරිණාමය පිළිබඳ වැරදි වගන්තිය වන්නේ කුමක් ද?
(1) පරිණාමය අඛණ්ඩ ක්‍රියාවලියකි
(2) විවිධ විශේෂ විවිධ වේගයන්ගෙන් පරිණාමය වේ.
(3) පරිසරයේ වෙනස්වීමක් නොමැතිව ප්‍රවේණි ද්‍රව්‍යවල ප්‍රභේදනයක් ඇති විය නොහැකිය.
(4) පරිණාමය වනුයේ ගහණයන් මිස පුද්ගලයන් නොවේ.
(5) පරිණාමය පිළිබඳ නූතන මතවල අඩුපාඩු කම් ඇත. (1990 Z)

(4) පහත සඳහන් අදහස් අතුරින් ඩාවින්ගේ පරිණාම වදයෙහි ඇතුලත් කොට නොමැති අදහස කුමක් ද?
(1) අධි නිෂ්පාදනය (2) තරඟය (3) පරිසරය මඟින් සිදුවන වරණය
(4) උච්තෝන්නතිය (5) ජනා හරහා ප්‍රවේණි වීම (1990 Z)

(5) ප්‍රවේණික ප්‍රභේදන විශාල වශයෙන් ඇති වන්නේ
(1) අංකුර වැඩීම මඟිනි (2) ද්වි ඛණ්ඩනය මඟිනි (3) බහු ඛණ්ඩනය මඟිනි
(4) කෞමාරෝද්භවය මඟින (5) ලිංගික ප්‍රජනනය මඟිනි (1990 Z)

(6) පහත සඳහන් ඒවා අතරෙන් පරිණාමය සඳහා සම්පූර්ණයෙන්ම අත්‍යවශ්‍ය වන්නේ
(1) විකෘතිය ය (2) තරඟයය (3) අධි නිෂ්පාදනයය
(4) පාරිසරික වෙනස්වීම් (5) අනුවර්තනය ය (1992 Z)

(7) සෑම ගහනයකම පරිණාමය සඳහා තිබීම අවශ්‍ය වන්නේ
(1) ප්‍රමුඛ ලක්ෂණය (2) නිලීන ලක්ෂණය (3) ප්‍රවේණික ප්‍රභේදනය
(4) සසම්භාවී සංවාසය (5) කලහකාරී චර්යාවය (1992 Z)

(8) පරිණාමයෙහි ඒකක
(1) ජානය (2) ජාන ක්ෂේත්‍ර ය (3) තනි තනි ජීවීන් ය
(4) ගහනයක් ය (5) ප්‍රජාවක් ය. (1993 Z)

(9) චාල්ස් ඩාවින් 'විශේෂ වල සම්භවයේ' ප්‍රකාශයට පත්කොට වසර 150 ක් පමණ කාලයක් ගත වී ඇත.
(1) එදා සිට මෙම වාදයට ප්‍රධාන වෙනස්කම් සිදු කර ඇත.
(2) එදා සිට බොහෝ ජීව විද්‍යාඥයින් මෙම වාදය ප්‍රතික්ෂේප කර ඇත.
(3) එදා සිට ජීව විද්‍යාවේ බොහෝ ක්ෂේත්‍රයන් තුළ සිදු කර ඇති අධ්‍යනයන් මෙම වාදය පරස්පර විරෝධී කරයි.
(4) එදා සිට වාදයේ ප්‍රධානතම ආධාරකරු වන්නේ මෙන්ඩල් ය.
(5) වාදයෙහි නූතන අනුවාදයට දී ඇති නාමය නව-ඩාවින් වාදයයි. (1993 Z)

(10) ප්‍රවේණිකව නිර්ණය කරනු ලබන ලක්ෂණ වල ස්වාභාවික වරණය නිසා සිදුවන ජෛව පරිණාමය පිළිබඳ වාදය හැඳින්වෙනුයේ.
(1) ලැමාක් වාදය ලෙසයි. (2) ඩාවින් වාදය ලෙසයි. (3) නව්‍යඩාවින් වාදය ලෙසයි
(4) වායිස්මාන්ගේ වාදය ලෙසයි. (5) වොලස්ගේ වාදය ලෙසයි. (1995 Z)

(11) ඩාවින්ට තම පරිණාම වාදය ඉදිරිපත් කිරීම සඳහා පදනම් වූ නිරීක්ෂණය වූයේ
(1) ස්වාභාවික වරණය (2) තරගය ය (3) උච්චතෝත්නිතිය ය
(4) ජීවන සටන ය (5) අධිජනනය ය (1996 Z)

(12) පහත සඳහන් වගන්ති අතුරෙන් සත්ත්ව පරිණාමය පිළිබඳව අසත්‍ය වන්නේ කුමක් ද?
(1) එය අඛණ්ඩව සිදුවන ක්‍රියාවලියකි.
(2) එය ගහනයක් තුළ පමණක් සිදු වේ.
(3) එය සෙමෙන් සිදුවන ක්‍රියාවලියකි
(4) එය ගහනයක් විසංගමනය වීම නිසා සිදුවිය හැකි ය.
(5) එය මිනිස් ක්‍රියාවන්ගේ ප්‍රතිඵලයක් නිසා සිදුවිය නොහැක. (1999 Z)

(13) ලැමාක්ට අනුව,
(1) අවයවයක් අඛණ්ඩව භාවිත කිරීම එහි ප්‍රමාණය මත බලපෑමක් නොකරයි.
(2) සත්ත්වයින් අතර ජීවන සටහනක් ඇත.
(3) විශේෂයක ඒකෙකයන් එකිනෙකාගෙන් ස්වල්ප ලෙස වෙනස් වේ.
(4) සත්ත්වයෙකු නිපදවනු ලබන ජනිතයින්ගේ සුහුඹුලන් බවට පත්වනුයේ ස්වල්ප දෙනෙක් පමණි.
(5) රූපානුදර්ශීය වෙනස්වීම් ප්‍රජනිතයන්ට ප්‍රවේණිගත වේ. (1999 Z)

(14) ගහනයක හාඩි – වයින්බර්ග් සමතුලිතතාව පවත්වාගැනීම සඳහා අවශ්‍ය වනුයේ පහත සඳහන් ඒවායින් කුමක් ද?
(1) වෙනත් ගහනවලින් ජාන ගලා ඒම
(2) විකෘති ඇති වීම.
(3) පර්යටනය සිදුවීම
(4) ඇලීලවල උන්නතිය සඳහා වරණිය වාසි තිබීම
(5) ජීවීන් අතර අහඹු ලෙස සංවාසය සිදුවීම (2001)

(15) පරිණාමික ක්‍රියාවලිය සම්බන්ධයෙන් වැරදි වනුයේ පහත සඳහන් කුමන වගන්තියද?
(1) විශේෂයන්ගේ ස්වභාවික නෂ්ටවීම පරිණාමික ක්‍රියාවලියෙහි කොටසකි
(2) ජෛව විවිධත්වයේ පරිණාමික ඉතිහාසයේ අවසාන ප්‍රධාන නෂ්ටවීම ඩයිනසෝරයන් නැති වි යාමය
(3) විශේෂයන් පරිණාමය වීමේ වේගය විශේෂයෙන් නෂ්ටවීමේ වේගයට වඩා සාමාන්‍යයෙන් වැඩිය
(4) මිනිස් ගහනය වැඩි වීමත් සමග විශේෂයන් නෂ්ටවීමේ වේගය අඩු වේ
(5) විශේෂයන්ගේ නෂ්ට වි යාම නව විශේෂ සම්භවනය වීමට උදවු වේ (2005)

(16) රසල් වොලස් පිළිබඳ ව පහත සඳහන් ප්‍රකාශ අතරෙන් කවරක් නිවැරදි ද?
(1) ඔහුගේ පරීක්ෂණ පරිචිත ලක්ෂණ ආවේණික වාදයට රුකුලක් විය.
(2) ඔහුගේ පරීක්ෂණ ජීවයේ ස්වයංසිද්ධි ජනන වාදය නිශප්‍රභ කළේ ය.
(3) ඔහු ,අකාබනික ද්‍රව්‍යවලින් කාබනික ද්‍රව්‍ය ඇති විය හැකි බව ඔප්පු කිරීම සඳහා පරීක්ෂණ පැවැත්වී ය.
(4) ඔහු ස්වාභාවික වරණ වාදයට සහාය වන සාක්ෂි සොයාගත්තේ ය.
(5) ඔහු පෘථිවියට ජීවය පැමිණියේ අභ්‍යවකාශයෙන් යැයි විශ්වාස කළේය. (2005)

(17) පහත දැක්වෙන සිද්ධීන් අතුරින් කවරක් ස්වාභාවික වරණයට නිදර්ශනයක් වේ ද?
(1) වී ප්‍රභේද දෙකක් මුහුම් කොට වඩා හොඳ වී ප්‍රභේදයක් නිපදවීම.
(2) කුඹුරකට වල්නාශක යෙදීම නිසා වී අස්වනු ප්‍රමාණය වැඩි වීම.
(3) කුඹුරකට කෘමිනාශක යෙදීම නිසා කෘමිනාශකවලට ප්‍රතිරෝධී කෘමීන් වැඩි වීම.
(4) කුඹුරකට කෘෂිරසායනික යෙදීම නිසා ජෛව විවිධත්වය අඩු වීම.
(5) දුඹුරු කීඩෑවන්ගේ ශීඝ්‍ර ව්‍යාප්තිය නිසා වී අස්වනු ප්‍රමාණය අඩු වීම. (2005)

(18) ජීවියෙක් තම ජීවිත කාලය තුලදී පරිසරයට අනුවර්තනය වීම් වශයෙන් වර්ධනය කර ගන්නා ලක්ෂණ තම ප්‍රජනිතයන්ට සම්ප්‍රේශනය කරයි'' මෙම ප්‍රකාශය ගැන නිවැරදි වන්නේ පහත සඳහන් ඒවා අතුරෙන් කවරක් ද?
(1) මෙය චාල්ස් ඩාවින් විශ්වාස කල මතයයි.
(2) මෙය ලැමාක් විසින් ඉදිරිපත් කරන ලද වාදයකි.
(3) මෙය ස්වාභාවික වරණ වාදයේ අත්‍යාවශ්‍ය අංගයකි
(4) මෙය තෝමස් මැල්තුස් විසින් ඉදිරිපත් කරන ලද වාදයකි.
(5) මෙය උච්තෝන්නිතය සඳහා අවශ්‍ය වේ. (2007)

(19) පහත සඳහන් ඒවා අතරින් කවරක් ඩාවින් හෝ වොලස් ස්වාභාවික ගහන ආශ්‍රිතව කළ නිරීක්ෂණයක් නොවේ ද?
(1) ස්වාභාවික ගහනවල අධික ප්‍රජනන විභවයක් ඇත.
(2) ගහනවල ජාන කිටු ඉතා දීර්ඝ කාලයක් තුළ නොවෙනස්ව පවතී.
(3) ගහනයක සාමාජිකයන් අතර විභේදන දැකිය හැකිය.
(4) ගහනයක සාමාජිකයන් අතර දැඩි තරගයක් ඇත.
(5) ගහනයක සාමාජිකයන් අතුරෙන් බොහොමයක් ප්‍රජනනය නොකරයි. (2009)

(20). ජීවීන්ගේ පරිණාමය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් කවරක් වැරදි ද?
(1) පෘතුවියේ ප්‍රථමයෙන් පරිණාමය වූ ජීවීන් නිර්වායු ප්‍රාග් න්‍යෂ්ටිකයන් ය.
(2) අධික ලෙස විශේෂනය වූ ජීවීන් නෂ්ට වීමේ අවදානමට ලක් වේ.
(3) ඉතා වාසිදායක ලක්ෂන වල පරිණාමය අනුවර්ති විකිරණ වලට හේතු වී ඇත.
(4) උරගයින්ගේ හා පක්ෂින්ගේ කවච සහිත බිත්තර සමාන්තර පරිණාමයට නිදර්ශනයක් වේ.
(5) අචලතාපිතාව ත්‍රිමාන දෘෂ්ටියට පෙර පරිණාමය විය. (2010)

**නිපුණතාව 3. 2. 0 : ජෛව විවිධත්වය ගවේෂණය**
**නිපුණතා මට්ටම : 3. 2. 1 විද්‍යාත්මක පදනමක් මත තක්සෝන ධූරාවලිය ගොඩ නගයි.**

(1) පෙනිසිලින් නිපදවන දිලීරයක විද්‍යානුකූල නාමය *Penicillium* (පෙන්සිලියම් නොටාටුම්) වේ. මෙහිදී *Penicillium* (පෙනිසිලියම්) යන්නෙන් නියෝජනය වන්නේ,
(1) ප්‍රභේද නාමය (2) විශේෂ නාමය (3) ගණ නාමය ය
(4) කුළයේ නාමය ය. (5) ගෝත්‍රයේ නාමය ය. (1987 – B)

(2) පහත සඳහන් අනුපිළිවෙලවල් නිවැරදි වන්නේ කුමක් ද?
(1) Class, Order, Species, Phylum, Genus
(2) Order, Genus, Species, Class, Phylum
(3) Genus, Species, Phylum, Class, Order
(4) Phylum, Class, Order, Genus, Species,
(5) Species, Genus, Class, Order, Phylum (1988 - Z)

(3) ජීවීන්ගේ ද්විපද නාමකරණය ප්‍රථමයෙන් යෝජනා කරන ලද්දේ,
(1) අර්නස්ට් හේකල් (Ernest Haeckel) ය. (2) රොබට් හුක් (Robert Hooke) ය.
(3) කාල් ලිනෙයස් (Carl Linnaeus) ය. (4) චාල්ස් ඩාවින් (Charles Darwin) ය.
(5) හෙන්රි ට්‍රයිමන් (Henry Trimen) ය. (1988 – B)

(4) පහත දැක්වෙන ඒවායින් කවරක් වර්ගීකරණ ඒකකයක් නොවෙයිද?
(1) ගණය (2) විශේෂය (3) ගෝත්‍රය (4) ක්ලෝනය (5) ප්‍රභේදය (1991 – B)

(5) ශාකයක සම්පූර්ණ විද්‍යාත්මක නාමෙහි අඩංගු විය යුත්තේ,
(1) ගණ නාමය, විශේෂ නාමය හා ප්‍රභේද නාමයයි.
(2) කුල නාමය, ගණ නාමය හා විශේෂ නාමයයි.
(3) ගණ නාමය හා විශේෂ නාමයයි.
(4) ගණ නාමය, විශේෂ නාමය සහ එම ශාකය මුලින්ම විස්තර කරන ලද තැනැත්තාගේ නාමයයි.
(5) ගණ නාමය හා ප්‍රභේද නාමයයි. (1994 – B)

(6) පහත සඳහන් ලක්ෂණ අතරින් කවරක්/කවර ඒවා ප්‍රාග් න්‍යෂ්ටික ජීවීන්ට පමණක් සීමා වේද?
(A) මියුරමික් අම්ලය සහිත සෛල බිත්ති
(B) නයිට්‍රජන් තිර කිරීමේ හැකියාව
(C) බහිශ්සෛලීය එන්සයිම නිපදවීමේ හැකියාව
(D) බීජාණු නිපදවීම
(E) ලිපොප්‍රෝටීන සෛල පටල තිබීම. (1994– B)

(7) පහත දැක්වෙන ඒවා අතුරින් කවරක් වර්ගීකරණ සමූහාවලියේ නිවැරදි අවරෝහණ අනුපිළිවෙල පෙන්වයිද?
(1) රාජධානිය, වංශය, වර්ගය, ගෝත්‍රය, කුලය, ගණය, විශේෂය
(2) රාජධානිය, වංශය, ගෝත්‍රය, වර්ගය, කුලය, ගණය, විශේෂය
(3) රාජධානිය, වංශය, ගෝත්‍රය, කුලය, වර්ගය, ගණය, විශේෂය
(4) රාජධානිය, වංශය, වර්ගය, කුලය, ගෝත්‍රය, ගණය, විශේෂය
(5) රාජධානිය, වංශය, කුලය, වර්ගය, ගෝත්‍රය, ගණය, විශේෂය (1995 – B)

(8) රාජධානි පහක් යටතේ ජීවීන් වර්ගීකරණය කිරීමේ දී වංශයක් ලෙස සලකනු නොලබන්නේ කුමක්ද?
(1) රයිසොපොඩා (2) සුමැස්ටිජිනා (3) එපිකොම්ප්ලෙක්සා
(4) ප්‍රොටොසොවා (5) සිලියොපොරා (1997- Z)

(9) ස්වභාවයෙන් නිර්ණය වන වර්ගීකරණ කාණ්ඩය වනුයේ
(1) වංශය ය. (2) වර්ගය ය. (3) කුලය ය.
(4) ගණය ය. (5) විශේෂය ය. (1997- Z)

(10) Monera, Protista, Fungi, Animalia සහ Plantae නම් රාජධානි 5කට Whittaker නැමැත්තා ජීවීන් වර්ගීකරණය කළේය. පහත සඳහන් රාජධානි අතුරෙන් කවරක ඒක සෛලීය ජීවීන් ඇතුළත් ද?
(1) Monera සහ Fungi වල පමණි.
(2) Protista සහ Monera වල පමණි.
(3) Monera, Protista සහ Plantae වල පමණි.
(4) Monera, Protista සහ Fungi වල පමණි.
(5) Plantae සහ Monera වල පමණි. (1998– B)

(11) ජෛව පටල සම්බන්ධව පහත සඳහන් ඒවායින් කවරක් වැරදි වේද?
(1) ජෛව පටලවල ලිපිඩ සහ ප්‍රෝටීන අඩංගු වේ.
(2) ජෛව පටල ආස්‍රැතිය නම් ක්‍රියාවලිය හා සම්බන්ධය.
(3) ජෛව පටල සෛලයේ ශක්තිය නිෂ්පාදනය හා සම්බන්ධ ය.
(4) මොනෙරාවන් (Monera) ජෛව පටලවලින් තොර ය.
(5) පටල ප්‍රෝටීන සෛලයේ එන්සයිමීය කාර්යභාරයක් ඉටු කරයි. (1998– B)

(12) පහත දැක්වෙන ඒවා අතුරෙන් කවරක් ජීවී ද්‍රව්‍යයේ සංවිධාන මට්ටමක් ලෙස සැලකිය නොහැකි ද?
(1) සෛලය (2) ගහණය (3) විශේෂය (4) පරිසර පද්ධතිය
(5) ජෛවගෝලය (1999– B)

(13) පහත දැක්වෙන ලක්ෂණ අතුරෙන් කවරක් ප්‍රාග්න්‍යෂ්ටික ජීවීන්ටත් සුන්‍යෂ්ටික ජීවීන්ටත් පොදු එකක් වේ ද?
(1) සෛල බිත්ති බහුඅවයවික ද්‍රව්‍යවලින් සෑදීම.
(2) වායුගෝලීය නයිට්‍රජන් තිර කිරීමේ හැකියාව.
(3) සෛල ප්ලාස්මීය සංසරණය
(4) අනූනන විභාජනය මගින් සිදුවන සෛල විභාජනය
(5) චාලක ප්‍රජනක සෛල නිපදවීම. (1999– B)

(14) පහත සඳහන් ඒවා අතුරින් වර්ගීකරණයේ ස්වභාවික ඒකකය වනුයේ කුමක් ද?
(1) වංශය/ කොට්ඨාසය (2) වර්ගය (3) ගෝත්‍රය (4) කුලය (5) විශේෂය (2000)

(15) ද්විපද නාමකරණයට අනුව මිනිසාගේ විද්‍යාත්මක නාමය නිවැරදිව නිරූපණය කරනු ලබන්නේ පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් ද?
(1) *Homo Sepians* (2) *Homo sapiens sapians* (3) Homo sapiens
(4) *Homo sapiens* (5) *Homo sepians* (2003)

(16) රාජධානි 5 ට ජීවීන් වර්ගීකරණය කිරීමේ දී භාවිත කරනු ලබන ප්‍රධාන උපමානය/ උපමාන වන්නේ පහත සඳහන් ඒවායින් කුමක් ද? / කුමන ඒවා ද?
(A) පෝෂණ ආකාරය (B) ප්‍රජනන ආකාරය (C) සෛලීය සංවිධානය
(D) සත්‍ය පටකවලට විභේදනය වීම (E) පරිණාමික අභිනති (2004)

(17) පහත සඳහන් කවර ලක්ෂණයක්/ ලක්ෂණ ප්‍රාග්න්‍යෂ්ටිකයින් තුළ පමණක් දැකිය හැකි ද?
(A) නිර්වායු ශ්වසනය
(B) සෛල බිත්තියේ මියුකොපෙප්ටයිඩ තිබීම.
(C) සෛල ප්ලාස්මයේ වෘත්තාකාර DNA දැරීම.
(D) වායුගෝලීය නයිට්‍රජන් බර කිරීමේ හැකියාව
(E) ද්විඛණ්ඩනයෙන් ප්‍රජනනය කිරීම. (2008)

(18) ජීවීන්ගේ රාජධානි 5 හා ජීවීන් එම රාජධානි වලට කාණ්ඩ කිරීමට භාවිත වන ලක්ෂණ පහත දැක්වේ. එම සංයෝජන අතුරෙන් කවරක් වැරදි ද?

| රාජධානිය | | ලක්ෂණ |
|---|---|---|
| (1) මොනෙරා | – | ඒකසෛලීය හෝ බහුසෛලීය, ප්‍රාග්න්‍යෂ්ටික, සෛල පටකවලට විභේදනය වී නැත. |
| (2) දිලීර | – | ඒකසෛලීය හෝ බහුසෛලීය, සුන්‍යෂ්ටික, සෛල පටකවලට විභේදනය වී නැත. |
| (3) ප්‍රොටිස්ටා | – | ඒකසෛලීය හෝ බහු සෛලීය, සුන්‍යෂ්ටික |
| (4) ශාක | – | බහුසෛලීය, සුන්‍යෂ්ටික, සෛල පටකවලට විභේදනය වී ඇත. |
| (5) සත්ත්ව | – | ඒකසෛලීය හෝ බහුසෛලීය, සුන්‍යෂ්ටික, බහුසෛලීය වන විට සෛල පටකවලට විභේදනය වී ඇත. |

(2009)

(19) පහත සඳහන් තක්සෝන අතුරෙන් පොදු ලක්ෂණ වැඩි ම සංඛ්‍යාවක් ඇත්තේ කුමන තක්සෝනයේද?
(1) වංශය (2) වර්ගය (3) ගණය (4) කුලය (5) ගෝත්‍රය (2010)

(20) ආකියා සහ යුකැරියා අධිරාජධානිවලට පොදු වනුයේ පහත සඳහන් ලක්ෂණ අතුරෙන් කුමක් ද/ කුමන ඒවා ද?
(A)RNA පොලිමරේස් වර්ග කිපයක් තිබීම.
(B)ප්‍රතිජීවකවලට සංවේදී නොවීම.
(C)සෙල පටලයේ ශාඛනය වූ ලිපිඩ අණු තිබීම.
(D)සෛල බිත්තියේ පෙප්ටිඩොග්ලයිකැන් නොතිබීම.
(E) සුන්‍යෂ්ටික සෛල සංවිධානය (2011)

(21) ආකියා රාජධානියේ සාමාජිකයෝ,
(1) පෙප්ටිඩොග්ලයිකැන් රහිත සෛල බිත්ති දරති.
(2) සර්වප්‍රත්‍යස්ථ වෙති.
(3) එක් වර්ගයකට අයත් RNA පොලිමරේස් පමණක් දරයි.
(4) බොහෝ ප්‍රතිජීවක වලට සංවේදී වෙති.
(5) ශාඛනය නොවූ ලිපිඩ අඩංගු සෛල පටල දරයි. (2013)

(22) ජීවීන් වර්ගීකරණයේ දී වංශය නැමැති තක්සෝනය හඳුන්වා දුන්නේ,
(1) කාර්ල් වූස් ය. (2) රොබට් විටෙකර් ය. (3) අර්නස්ට් හේකල් ය.
(4) කැරොලිස් ලිනේයස් ය. (5) ඇරිස්ටෝටල් ය. (2016)

(23) සෛල පටලයේ ශාඛනය වූ ලිපිඩ අඩංගු ගණයක් අන්තර්ගත වන්නේ පහත සඳහන් කුමන කාණ්ඩයේ ද?
1) *Lyngbya, Halobacterium, Cycas* සහ *Agaricus*
2) *Clostridium, Streptomyces, Fasciola* සහ *Chloroxylon*
3) *Melursus, Staphylococcus, Allomyces* සහ *Garcinia*
4) *Rhizopus, Hevea, Salmonella* සහ *Gelidium*
5) *Macrognathus, Mucor, Thiobacillus* සහ *Caryota* (2017)

(24) ජීවීන්ගේ වර්ගීකරණය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
1) හොඳින් සංවිධානය වූ න්‍යෂ්ටියක් නොදරන බැවින් වයිරස කිසිම රාජධානියකට අයත් නොවේ.
2) ප්‍රොටිස්ටා යනු විවිධ පරිණාමික සම්භවයන් සහිත ජීවීන් අන්තර්ගත ස්වාභාවික රාජධානියකි.
3) ගණයක් තුළ දැකිය හැකි පොදු ලක්ෂණ සංඛ්‍යාව, විශේෂයක් තුළ දැකිය හැකි පොදු ලක්ෂණ සංඛ්‍යාවට වඩා වැඩි ය.
4) ශාක රාජධානිය මුලින් ම හඳුනාගත්තේ කැරොලස් ලිනේයස් ය.
5) අධිරාජධානි තුනේ වර්ගීකරණය හඳුන්වා දුන්නේ රොබට් විටේකර් ය. (2018)

## වෛරස

(1) වයිරස පිළිබඳව නිවැරදි ප්‍රකාශයක් වන්නේ පහත සඳහන් කවරක්ද?
(1) වයිරස සියල්ලම පරපෝෂිත වේ.
(2) වයිරස පැවතිය හැක්කේ සජීවී සෛල තුළ පමණි.
(3) සෑම වයිරසයකම RNA ඇත.
(4) වයිරස නිර්වායු ශ්වසනය සිදු කරයි.
(5) වයිරසවල බාහිර ස්තරය සෑදී ඇත්තේ පොලිසැකරයිඩවලිනි. (1986 – B)

(2) වෛරසවල සාපේක්ෂව සරල ව්‍යුහයක් ඇතත් ඔවුන් පෘථිවිය මත පරිණාමය වූ ප්‍රථම ජීවීන් ලෙස සැලකිය නොහැක්කේ,
(1) වෛරසවල රයිබොනියුක්ලෙයික් අම්ල මදයක් ඇති නිසාය.
(2) වෛරස ප්‍රෝටීනවලින් සෑදී ආවරණයකින් සමන්විත නිසාය.
(3) වෛරස ඉතා මෑතකදී සොයාගත් නිසාය.
(4) වෛරසවලට ජීවී සෛලවලින් පිට ගුණනය වීමෙ හැකියාව නොමැති නිසාය.
(5) වෛරස අනෙක් ජීවීන් හට රෝග ඇති කරන නිසාය. (1987 – B)

(3) වෛරස පිළිබඳ නිවැරදි ප්‍රකාශ/ප්‍රකාශය තෝරන්න.
(A) වෛරස එක ධාරකයෙකුගෙන් තවත් ධාරකයෙකුට සම්ප්‍රේෂණය කළ හැකිය.
(B) ශ්වසනයේ දී වෛරස ශක්තිය නිපදවයි.
(C) පරීක්ෂණාගාරයේ සජීවී රෝපනවල වෛරස ගුණනය කළ හැකිය.
(D) වෛරස ස්ඵටිකරණය කළ හැකිය.
(E) වෛරස සචල වේ. (1987– B)

(4) වයිරසවල ප්‍රවේණි තොරතුරු සංප්‍රේෂණය වන්නේ පහත සඳහන් කවර ද්‍රව්‍ය මගින්ද?
(1) කාබෝහයිඩ්‍රේට (2) ප්‍රෝටීන (3) ලිපිඩ
(4) න්‍යෂ්ටික අම්ල (5) ඇමයිනො අම්ල (1989 – B)

(5) වෛරස, අනිකුත් ජීවීන්ගෙන් වෙනස් වන්නේ වෛරසවල,
(1) ප්‍රෝටීන් නැති නිසාය. (2) න්‍යෂ්ටික අම්ල නැති නිසාය.
(3) සෛලීය සංවිධානයක් නැති නිසාය. (4) ප්‍රවේණි ද්‍රව්‍ය නැති නිසාය.
(5) ප්‍රජනක යාන්ත්‍රණයක් නැති නිසාය. (1990 – B)

(6) වෛරස බැක්ටීරියාවලින් වෙනස් වන්නේ ඒවා,
(1) ශාකවලට හා සත්වයන්ට රෝග ඇති කරන නිසාය.
(2) ප්‍රෝටීන හා න්‍යෂ්ටික අම්ල දරන නිසාය.
(3) ජීව සෛල තුළ පමණක් බහුගුණනය වන නිසාය.
(4) පරිවෘත්තිය යාන්ත්‍රණ නොදරන නිසාය.
(5) පෘෂ්ඨවංශිකයන් තුළ ප්‍රතිදේහ නිෂ්පාදනය නොකරන නිසාය. (1993– B)

(7) වයිරසවල පහත දක්වෙන ලක්ෂණ අතරින් කවර ලක්ෂණයක් ඒවා පෘථිවියේ ප්‍රථමයෙන් පරිණාමය වූ ජීවීන් විය නොහැකි යයි පෙන්නුම් කරන්නේද?
(1) වයිරසවල න්‍යෂ්ටික අම්ල හා ප්‍රෝටීන අඩංගු වීම.
(2) වයිරස සෛලීය සමංගිකරණයන් නොදක්වීම.
(3) වයිරසවල බහුගුණනය විය හැක්කේ ජීවී සෛල තුළ පමණක් වීම.
(4) වයිරසවල සාපේක්ෂ වශයෙන් සරල ව්‍යුහයක් දක්වීම.
(5) වයිරස ස්ඵටිකීකරණය කළ හැකි වීම. (1994 – B)

(8) වෛරස පිළිබඳ පහත දක්වෙන ප්‍රකාශ අතරින් කවරක් වැරදිද?
(1) ඒවා ආලෝක අන්වීක්ෂයෙන් දැකිය නොහැකිය.
(2) ඒවායේ න්‍යෂ්ටික අම්ලය DNA, RNA හෝ වේ.
(3) ඒවාට විකෘත විය හැකිය.
(4) එවා ප්‍රාග්න්‍යෂ්ටික ජීවීන්ය.
(5) ඒවාට ප්‍රෝටීනවලින් සැදි ආවරණ ඇත. (1995 – B)

(9) ජීව විද්‍යාඥයින් වයිරස අජීවී යැයි සලකන්නේ ඒවා,
(A) ශ්වසනය නොකරන නිසා ය.
(B) ප්‍රජනනය නොකරන නිසා ය.
(C) බාහිර උත්තේජනයන්ට ප්‍රතිචාර නොදක්වන නිසා ය.
(D) පෝෂක ද්‍රව්‍ය ලබාගන්නේ හෝ භාවිත නොකරන නිසා ය.
(E) විකෘති නොවන නිසා ය. (1998– B)

(10) වෛරස පිළිබඳ පහත දක්වෙන ප්‍රකාශ අතුරෙන් කවරක් වැරදි ද?
(1) ඒවා හි ප්‍රවේණි ද්‍රව්‍යය RNA හෝ DNA විය හැකි ය.
(2) ඒවා හි නියුක්ලෙයික් අම්ල ප්‍රෝටීන කොපුවකින් ආවරණය වී ඇත.
(3) ඒවාට ගුණනය විය හැක්කේ සජීවී සෛල තුළ පමණි.
(4) පහත් උෂ්ණත්වවල දී ඒවා හි ආසාදන හැකියාව නැති වේ.
(5) ඇතැම් වෛරස කැස්සේදී කෙළ බිංදු මගින් සම්ප්‍රේෂණය වේ. (1999– B)

(11) දුම්කොළ විචිත්‍ර වෛරසය,
A) RNA දරයි. B) DNA දරයි. C) හෙලික්සාකාර වෛරසයකි.
D) කෘමීන් මගින් සම්ප්‍රේෂණය වේ. E) ප්‍රාවරයක් සහිත වෛරසයකි. (2007)

**නිපුණතාව 3. 2. 2 : බැක්ටීරියා සහ සයනොබැක්ටීරියා**

- 1 සිට 3 තෙක් ප්‍රශ්න පදනම් වී ඇත්තේ පහත සඳහන් ජීවීන් (A -E) පස් දෙනා මත ය.
  (A) *Rhizobium* (රයිසෝබියම්)
  (B) *Aleurina* (ඇලියුරයිනා)
  (C) *Anabaena/Nostoc* (ඇනබිනා/නොස්ටොක්)
  (D) *Cladophora* (ක්ලැඩොපොරා)
  (E) *Clostridium* (ක්ලොස්ට්‍රිඩියම්)

(1) ඉහත සඳහන් ජීවීන් අතුරින් හෙටරොසිස්ට් සහිත වන්නේ කවර ජීවියා/ජීවීන් ද?
(2) ඉහත සඳහන් ජීවීන් අතුරින් සංවිධානය වූ න්‍යෂ්ටි සහිත වන්නේ කවර ජීවියා/ජීවීන් ද?
(3) ඉහත සඳහන් ජීවීන් අතුරින් ස්වයංපෝෂිත වන්නේ කවර ජීවියා/ජීවීන් ද? (1986– B)

(4) සත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ තෝරන්න
(1) සමහර බැක්ටීරියාවල සෛල බිත්තියට පිටතින් නානු ස්ථරයක් හෝ කෝෂ්ඨයක් ඇත.
(2) ක්ෂය රෝගය ඇති කරනුයේ වෛරසයක් මගිනි.
(3) වර්ණ ගැන්වීමෙන් අනතුරුව ආලෝක අන්වීක්ෂයකින් බැක්ටීරියාවල කශිකා නිරීක්ෂණය කළ හැකිය.
(4) සමහර කෑම වර්ග නරක් වීම වැලැක්වීම සඳහා දිය ලුණු එකතු කරනු ලැබේ.
(5) ටින්වල ඇසුරූ මාළුවල බොහෝ විට ජීව්‍ය බැක්ටීරියා සෛල තිබේ. (1987– B)

(5) වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ස්වාභාවික වර්ගීකරණ පද්ධතියක් පදනම් වී ඇත්තේ පරිණාමික බන්ධුතා මතය.
(2) විභාජක සෛලවල වැඩි ප්‍රෝටීන් සංශ්ලේෂණ වේගයක් ඇත.
(3) ඇතැම් බැක්ටීරියා බීජාණුවලට නටන ජලයේ උෂ්ණත්වයට ඔරොත්තු දිය හැකිය.
(4) ඇතැම් වෛරසවලට සජීවී සෛලවලින් පිටත ජීවන චක්‍රය සම්පූර්ණ කළ හැකිය.
(5) ඇතැම් ආවෘත බීජක (ඇන්ජියෝස්පර්මේ) ශාක ප්‍රතිබැක්ටීරියා ද්‍රව්‍ය නිපදවයි. (1990 – B)

(6) නීලහරිතයන් සත්‍ය බැක්ටීරියාවලට සමාන වන්නේ ඒ දෙකොටසම,
(1) පයිකොසයනින් වර්ණක දරන බැවිනි.
(2) විෂමපෝෂක බැවිනි.
(3) ප්‍රාග්න්‍යෂ්ටික බැවිනි.
(4) කයිටින්වවලින් සෑදුන සෛල බිත්ති සහිත වන බැවිනි.
(5) කශිකා මගින් චලනය දක්වන බැවිනි. (1990 – B)

(7) බැක්ටීරියා වර්ණදේහයේ අඩංගු- වන්නේ,
(1) RNA පමණි. (2) DNA පමණි. (3) RNA හා DNA පමණි.
(4) DNA හා ප්‍රෝටීන පමණි. (5) RNA, DNA හා ප්‍රෝටීන පමණි. (1991 – B)

(8) රසායනික සංස්ලේෂක බැක්ටීරියා පසෙහි සරුබව වැඩිකරන්නේ,
(1) ඇමෝනිකරණය මගින් ය. (2) නයිට්‍රිහරණය මගින් ය.
(3) නයිට්‍රජන් තිර කිරීම මගින් ය. (4) නයිට්‍රිකරණය මගින් ය.
(5) ප්‍රෝටීන් ජීරණය මගින් ය. (1992 – B)

(9) පසෙහි ඇති ඇමෝනියා නයිට්‍රයිට බවට ඔක්සිකරණය කරන බැක්ටීරියා වනුයේ,
(1) *Rhizobium* (2) *Nitrobacter* (3) *Pseudomonas*
(4) *Azotobacter* (5) *Bacillus* (1993– B)

(10) *Clostridium tetani* සම්බන්ධයෙන් පහත සඳහන් ඒවා අතරින් කවරක් වැරදිද?
(1) එය වෛකල්පික නිර්වායු බැක්ටීරියාවකි. (2) එය මෘතෝප ජීවියෙකි.
(3) එය බහිර්විෂ නිපදවන ජීවියෙකි. (4) එය බීජාණු නිපදවන ජීවියෙකි.
(5) එය පසෙහි සුලබය. (1994 – B)

(11) ඇතැම් බැක්ටීරියාවලට උණුදිය උල්පත් ජලයේ පරිවෘත්තීය ක්‍රියා සිදු කළ හැක්කේ,
(1) ඒවාට අවට පරිසරයේ ජලයේ උෂ්ණත්වයට වඩා බෙහෙවින් අඩු අභ්‍යන්තර උෂ්ණත්වයක් පවත්වා ගත හැකි බැවිනි.
(2) වැඩි උෂ්ණත්වය පරිවෘත්තීය ක්‍රියා පහසු කරන නිසාය.
(3) ඒවායේ එන්සයිම වැඩි උෂ්ණත්වවලදීත් ක්‍රියාකාරී වන නිසාය.
(4) ඒවායේ එන්සයිම උෂ්ණත්වයට සංවේදී නොවන නිසාය.
(5) ඒවායේ ප්‍රධාන උත්ප්‍රේරකයන් ප්‍රෝටීන් නොවන අණුවලින් සෑදී ඇති නිසාය.(1994 – B)

(12) පහත දක්වෙන ප්‍රකාශ අතරින් කවරක් වැරදිද?
(1) වෛරස සියල්ල අනිවාර්ය පරපෝෂිත වේ.
(2) ආවෘතබීජක සියල්ල ස්වංපෝෂී වේ.
(3) බැක්ටීරියා සියල්ල විෂමපෝෂී නොවේ.
(4) දිලීර සියල්ල විෂමපෝෂී වේ.
(5) බැක්ටීරියා සියල්ල ප්‍රාග්න්‍යෂ්ටික වේ. (1996 – B)

(13) සියලු ම බැක්ටීරියාවල දැකිය නොහැක්කේ පහත සඳහන් ඒවා අතරින් කවරක්/කවර ඒවාද?
(A) කෝෂ්ඨය (B) රයිබසෝම (C) කශිකා (D) අන්තඃබීජාණු
(E) සෛල පටල (1996– B)

(14) පහත සඳහන් බැක්ටීරියා කාණ්ඩ අතුරින් කවර කාණ්ඩයක් පසෙහි ඇමෝනියා ඔක්සිකරණය කරයිද?
(1) නයිට්‍රජන් තිර කරන බැක්ටීරියා (2) නයිට්‍රිහාරි බැක්ටීරියා
(3) මූල ගැටිති බැක්ටීරියා (4) නයිට්‍රිකාරි බැක්ටීරියා
(5) සයනොබැක්ටීරියා (1997– B)

(15) මයිටොකොන්ඩ්‍රියා සහ අන්තඃප්ලාස්මීය ජාලිකාවක් නොමැති ස්වයංපෝෂී ජීවීන් අඩංගු වන්නේ පහත සඳහන් කුමන ලැයිස්තුවේ ද?
(1) *Anabaena, Nitrosomonas* හරිත සල්ෆර් බැක්ටීරියා
(2) *Oscillatoria, Vibrio, Nitrosomonas*
(3) හරිත සල්ෆර් බැක්ටීරියා, *Vibrio, Nitrosomonas*
(4) දුම්කොළ විචිත්‍ර වයිරස, *Anabaena, Nitrosomonas,* හරිත සල්ෆර් බැක්ටීරියා
(5) *Anabaena, Oscillatoria, Vibrio* (1998– B)

(16) බැක්ටීරියා පිළිබඳ පහත සඳහන් ඒවායින් කුමක් වැරදි ද?
(1) කාබනික ද්‍රව්‍ය සරල සංයෝගවලට බිඳ දැමීම සඳහා බහිර්සෛලීය එන්සයිම ශ්‍රාවය කරයි.
(2) සමජන්මාණුක සංයුග්මනය පෙන්වයි.
(3) මොවුන්ට ලිංගික ක්‍රමවලින් ප්‍රජනනය කළ හැකි ය.
(4) සමහරක් අනිවාර්ය නිර්වායු ජීවීන් වේ.
(5) මොවුන් පෘථිවිය මත ඇති වූ පළමු ජීවීන් අතර වේ. (1998– B)

(17) ජෛව පටල සම්බන්ධව පහත සඳහන් ඒවායින් කවරක් වැරදි වේද?
(1) ජෛව පටලවල ලිපිඩ සහ ප්‍රෝටීන අඩංගු වේ.
(2) ජෛව පටල ආස්‍රැතිය නම් ක්‍රියාවලිය හා සම්බන්ධය.
(3) ජෛව පටල සෛලයේ ශක්තිය නිෂ්පාදනය හා සම්බන්ධ ය.
(4) මොනෙරාවන් (Monera) ජෛව පටලවලින් තොර ය.
(5) පටල ප්‍රෝටීන සෛලයේ එන්සයිමීය කාර්යභාරයක් ඉටු කරයි. (1998– B)

(18) සයොනොබැක්ටීරියා පිළිබඳ ව පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් කවරක් වැරදි ද?
(1) ඒවා කශිකා සහිත සෙල නිපදවන්නේ නැත.
(2) ඒවා ජල දූෂණය පිළිබඳ දර්ශක ලෙස ප්‍රයෝජනයත් වේ.
(3) ඒවා හි ප්‍රධාන ප්‍රභාසංශ්ලේෂක වර්ණකය ක්ලෝරොපිල් a වේ.
(4) ඒවා හි සෛල බිත්තිවල මියුකොපෙප්ටයිඩ ඇත.
(5) ඒවා හෙටරොසිස්ට මගින් අලිංගික ව ප්‍රජනනය කරයි. (1999– B)

(19) අකාබනික කාබන් ප්‍රභවයකින් කාබන් ලබා ගන්නේ පහත සඳහන් ජීවීන් අතුරෙන් කවරෙක් ද?
(1) *Azotobacter* (2) *Nitrosomonas* (3) *Pseudomonas*
(4) *Streptococcus* (5) *Clostridium* (1999– B)

(20) පහත දක්වෙන ප්‍රකාශ අතුරෙන් බැක්ටීරියා ප්ලාස්මිඩයක් පිළිබඳ ව වැරදි වන්නේ කුමක් ද?
(1) එය චක්‍රීය DNA අණුවකි.
(2) සෛල විභාජනයේ දී එය ප්‍රතිවලිත වී දුහිතෘ සෛල සමග ගමන් කරයි.
(3) එහි ඇත්තේ ජාන සුළු සංඛ්‍යාවක් පමණි.
(4) එය ප්‍රයෝජනවත් කාර්යයන් ඉටු කරයි.
(5) සෛලයේ පැවැත්ම සඳහා එය අත්‍යවශ්‍ය ය. (2004)

(21) සයනොබැක්ටීරියා පිළිබඳ පහත දක්වෙන ප්‍රකාශ අතුරෙන් කවරක් නිවැරදි ද?
(1) ඒවා සියල්ල කශික මගින් සංචරණය කරයි.
(2) ඒවා සියල්ල මිරිදියෙහි දැකිය හැකි ය.
(3) ඒවා සියල්ල සණාවාස සාදයි.
(4) ඒවා සියල්ල වායුගෝලීය නයිට්‍රජන් තිර කරයි.
(5) ඒවා සියල්ල ක්ලොරොෆිල් නොවන ප්‍රභාසංස්ලේෂණ වර්ණක දරයි. (2008)

(22) වෛරස බැක්ටීරියාවලින් වෙනස් වන්නේ,
(1) වෛරස ශාකවලට සහ සතුන්ට රෝග ඇති කරන නිසා ය.
(2) වෛරසවල RNA හා DNA ඇති නිසා ය.
(3) වෛරස සෛලීය සංවිධානයක් නොපෙන්වන නිසා ය.
(4) වෛරස විද්‍යාගාරයේ රෝපණය කළ නොහැකි නිසා ය.
(5) වෛරස ස්වභාවිකව පුළුල්ව ව්‍යාප්ත වී ඇති නිසා ය. (2013)

## නිපුණතාව 3. 2. 3 : ප්‍රොටිස්ටා රාජධානිය

(1) නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ප්‍රෝටීන් සංශ්ලේෂණයේ දී DNA වලින් කිසිදු කාර්යභාරයක් ඉටු නොවේ.
(2) සුන්‍යෂ්ටික සෛලවල ප්‍රවේණි තොරතුරු සාමාන්‍යයෙන් වර්ණදේහික RNA වල පවතී.
(3) බොහෝ පරිවෘත්තීය ප්‍රතික්‍රියා සඳහා අවශ්‍ය ශක්තිය සැපයෙන්නේ ATP අණු මගිනි.
(4) ඇස්කොමයිසිටීස් දිලීරවල සහ හරිත ඇල්ගිවල සෛල බිත්ති රසායනිකව එක සමානය.
(5) සෑම ස්වයංපෝෂී ජීවියෙකු තුළම ක්ලොරොෆිල් a අඩංගු වේ. (1986 – B)

(2) හරිත ඇල්ගේ සහ රතු ඇල්ගේ සංසන්දනය කරන පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ක්ලෝරොෆිල් b හරිත ඇල්ගේවල ඇතත් රතු ඇල්ගේවල නොමැත.
(2) ක්ලෝරොෆිල් a හරිත ඇග්ගේවල මෙන්ම රතු ඇල්ගේවල ද ඇත.
(3) හරිත ඇල්ගේ කෂිකා සහිත චල බීජාණු නිපදවූවත් රතු ඇල්ගේ ඒවා නිපදවන්නේ නැත.
(4) සමහර හරිත ඇල්ගේවල පයිරනොයිඩ ඇතත් රතු ඇල්ගේවල ඒවා නොමැත.
(5) හරිත ඇල්ගේවල ලිංගික අවයව බහුසෛලීය වන නමුත් රතු ඇල්ගෙවල එසේ නොවේ. (1986 – B)

(3) එගාර් ලබාගන්නේ ඇතැම්,
(1) මිරිදිය ඇල්ගේවලිනි. (2) කරදිය ඇල්ගේවලිනි. (3) ලයිකනවලිනි.
(4) දිලීරවලිනි. (5) නීලහරිත ඇල්ගේවලිනි. (1986 – B)

(4) නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ක්ලෝරොපිසියේ සාමාජිකයන් ප්‍රාග්න්‍යෂ්ටික වේ.
(2) ඇතැම් පියොපිසියේ සාමාජිකවන් ඒකසෛලික වේ.
(3) රොඩොපිසියේ සාමාජිකයන් කශිකාධාර සෛල නිපදවයි.
(4) බැසිලේරියොපිසියේ සාමාජිකයන් බහුසෛලික තලස ඇති කරයි.
(5) ඇතැම් නීල හරිත සාමාජිකයන් සහජීවන සංගම් ඇති කරයි. (1990 – B)

(5) ආලෝක අන්වීක්ෂයකින් පයිරිනොයිඩ දැකගත හැක්කේ,
(1) *Chlamydomonas* (ක්ලැමිඩොමොනාස්), ඩයටම හා ඩෙස්මිඩවලය.
(2) *Spirogyra* (ස්පිරෝගයිරා), ඩයටම හා ඩෙස්මිඩවලය.
(3) ඩෙස්මිඩ, යීස්ට් හා නීල හරිතවලය.
(4) *Spirogyra* (ස්පිරෝගයිරා), ඩෙස්මිඩ හා *Chlamydomonas* (ක්ලැමිඩොමොනාස්) වලය.
(5) *Spirogyra* (ස්පිරෝගයිරා), ඩෙස්මිඩ හා බැක්ටීරියාවලය. (1990 – B)

(6) වැරදි ප්‍රකාශය/ප්‍රකාශ තෝරන්න.
(A) සියලුම ශාක හෝමෝන ප්‍රෝටීන වේ.
(B) සියලුම ඇල්ගේ ස්වයංපෝෂී වේ.
(C) සියලුම මොනොසැකරයිඩ හෙක්සෝස වේ.
(D) සියලුම ස්වයංපෝෂීන් ප්‍රභාසංශ්ලේෂකයින් ය.
(E) සියලුම දිලීර මෘතෝප ජීවීන් ය. (1991– B)

(7) ඇල්ගී ගැන පහත සඳහන් ප්‍රකාශ අතරින් කවරක්/කවර ඒවා නිවැරදි වේද?
(1) ශාක දේහය විභේදනය වී නැත.
(2) බොහෝමයක්ම ඇල්ගී ජල ශාක වේ.
(3) ඒවායේ ලිංගික ව්‍යුහයන් වඳ සෛල ස්ථරයකින් ආවරණය වී ඇත.
(4) ඇල්ගී ජල පරිසර පද්ධතිවල වැදගත් ප්‍රාථමික නිෂ්පාදකයෝ වෙති.
(5) ඇල්ගී බොහෝමයක්ම ප්‍රාග්න්‍යෂ්ටික වේ. (1991– B)

(8) වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ලයිකන බොහොමයක අඩංගු වන්නේ හරිත ඇල්ගේ සහ බැසිඩියොමිසේටෙය.
(2) ඇතැම් ලයිකන වල අලිංගික ප්‍රජනනයක් දැකිය හැකිය.
(3) දුඹුරු ඇල්ගේ හොඳින්ම වැඩෙන්නේ සෞම්‍ය කලාපීය මුහුදුවලය.
(4) මුහුදු ජලයේ ඇති ශාක ජලවාංග බොහොමයක්ම හරිත ඇල්ගේ සහ රන්වන් දුඹුරු ඇල්ගේ වේ.
(5) පයිකොසයනින් සහ පයිකොඑරිත්‍රින් වර්ණක සයනො බැක්ටීරියා සහ රතු ඇල්ගේවලට පමණක් පොදුය. (1992 – B)

(9) පහත දැක්වෙන ජීවීන් අතුරින් කුමක්/කුමන ඒවා අකාබනික ප්‍රභවයන්ගෙන් කාබන් අවශ්‍යතා සපයා ගන්නේද?
(A) Nitrosomonas (B) Anabaena (C) Chlamydomonas
(D) Clostridium (E) Pseudomonas (1993– B)

(10) හරිත ඇල්ගී පිළිබඳව පහත සඳහන් ඒවා අතරින් කුමක් වැරදිද?
(A) ඒවා කඳ පත්‍ර හා මුල් වශයෙන් විභේදනයක් නොපෙන්වති.
(B) ඒවා බොහෝමයක් ජලජ හෝ තෙත් වාසස්ථානවලට සීමා වේ.
(C) ඒවා ප්‍රාග්න්‍යෂ්ටික ජීවීන් ය.
(D) ඇතැම් හරිත ඇල්ගීවලට වායුගෝලීය නයිට්‍රජන් තිර කළ හැක.
(E) ඒවා බොහෝමයක් ස්වයංපෝෂී වේ. (1993– B)

(11) රොඩොපිසියේ ගැන පහත දැක්වෙන ප්‍රකාශ අතරින් කවරක් වැරදිද?
(1) ප්‍රධාන ප්‍රභාසංශ්ලේෂක වර්ණකය ක්ලෝරොපිල් a වේ.
(2) සෛල බිත්ති සෙලියුලෝස් හා පෙක්ටික් ද්‍රව්‍යයන්ගෙන් සෑදී ඇත.
(3) වාසස්ථානය බොහෝවිට කරදිය වේ.
(4) සංචිත ආහාර ලැමිනේරින් හා මැනිටෝල්ය.
(5) කශිකාධර සෛල නොමැත. (1995 – B)

(12) නිල හරිත ගැන පහත දැක්වෙන ප්‍රකාශ අතරින් කවරක් වැරදිද?
(1) ඒවා ජලජපද්ධතිවල ප්‍රාථමික නිෂ්පාදකයන් ලෙස වැදගත් කාර්යයක් ඉටු කරයි.
(2) ඒවා සුපෝෂිත ජලාශවල ශීඝ්‍රයෙන් බෝවී පැතිරී යයි.
(3) ඇතැම් ඒවා සහජීවන සංගම් ඇති කරයි.
(4) ඒවායේ ක්ලෝරපිල් a හා b අඩංගු වේ.
(5) ඒවායේ ලිංගික ප්‍රජනන ව්‍යුහයන් සොයා ගෙන නැත. (1995 – B)

(13) ප්‍රොටිස්ටාවන් පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් කවරක්/ කවර ඒවා නිවැරදි ද?
(A) ඔවුන් ඒකසෛලික ය.
(B) ඔවුන්ගෙන් සමහරක් ප්‍රාග්න්‍යෂ්ටික ය.
(C) ඔවුහු ජලජ සහ භෞමික වාසස්ථානවල ජීවත් වෙති.
(D) ඔවුන්ගේ සෛල බිත්ති සෙලියුලෝස්වලින් සෑදී ඇත.
(E) ඔවුන් එක්කෝ අවශෝෂක නැතහොත් ප්‍රභාසංස්ලේෂක වේ. (2008)

(14) ක්‍රිසොෆයිටා වංශය ප්‍රොටිස්ටා රාජධානියට අයත් අනෙක් වංශවලින් වෙනස් වන්නේ පහත දැක්වෙන කුමන ලක්ෂණය නිසා ද?
(1) වර්ධක සෛලවල කශිකා නොමැති වීම.
(2) එක් සංචිත ඵලයක් ලෙස මැනිටෝල් තිබීම.
(3) ප්‍රභාස්වයංපෝෂීන්ට අමතරව රසායනික ස්වයංපෝෂීන් සිටීම.
(4) ප්‍රභාසංස්ලේෂක වර්ණකයක් ලෙස ක්ලෝරෝෆිල් – b නොතිබීම.
(5) සෛල බිත්තියේ සිලිකා තිබීම. (2012)

(15) රොඩොෆයිටා වංශයේ සාමාජිකයන් පිළිබඳ පහත සඳහන් කවරක් නිවැරදි ද?
(1) ඒකසෛලීය හෝ බහුසෛලීය හෝ වේ.
(2) ක්ලොරොෆිල, කැරොටීන හා ඇස්කොෆිල දරයි.
(3) ප්‍රජනක සෛලවල කශිකා නොමැත.
(4) සෛල බිත්තිවල සෙලියුලෝස් හා පෙක්ටින් ඇත.
(5) මැනිටෝල් සංචිත ආහාරයක් වේ. (2013)

(16) කශිකා නොදරන ඒකසෛලීය ප්‍රොටිස්ටාවෙකු,
1) පෙනිසිලින්වලට සංවේදී විය හැකි ය.
2) ෆියුකොසැන්තින් දැරිය හැකි ය.
3) විෂමපෝෂී විය හැකි ය.
4) රොඩොෆීටා වංශයට අයත් විය හැකි ය.
5) ෆයිකොසයනින් දැරිය හැකි ය. (2018)

**නිපුණතා මට්ටම 3. 2. 4 : ශාක රාජධානිය**

- 01 සිට 03 දක්වා ප්‍රශ්න පහත දී ඇති ජීවී ගණ මත පදනම් වේ.
(A) *Clostridium* (ක්ලොස්ට්‍රිඩියම්)
(B) *Loranthus* (ලොරැන්තස්)
(C) *Cladophora* (ක්ලැඩොපොරා)
(D) *Saccharomyces* (සැකරෝමයිසීස්)
(E) *Nephrolepis* (නෙප්රොලෙපිස්)

(1) ක්ලොරොපිල් b ඇති ජීවියා / ජීවීන් වන්නේ,
(1) B පමණයි
(2) C පමණයි
(3) B සහ C පමණයි
(4) B, C සහ D පමණයි
(5) B, C සහ E පමණයි
(1987 – B)

(2) මයිටොකොන්ඩ්‍රියා නොමැති ජීවියා/ජීවීන් වන්නේ,
(1) A පමණයි
(2) B පමණයි
(3) A සහ B පමණයි
(4) A සහ D පමණයි
(5) A,B සහ D පමණයි
(1987 – B)

(3) නිර්වායු තත්ත්ව යටතේ පමණක් වැඩෙන ජීවියා/ජීවීන් වන්නේ,
(1) A පමණයි
(2) C පමණයි
(3) D පමණයි
(3) A සහ C පමණයි
(5) A සහ D පමණයි
(1987 – B)

(4) එක්තරා ආවෘත බීජක ශාකයක වර්ණදේහ සංඛ්‍යාව 2n නම් එහි පහත සඳහන් කවර ව්‍යුහයක එක් එක් න්‍යෂ්ටියේ වර්ණ දේහ සංඛ්‍යාව n වන්නේද?
(1) බීජාවරණය (2) පුෂ්පයක කලංකය (3) පරාග කණිකාව
(4) බීජයක භ්‍රෑණපෝෂය (5) පුෂ්පයක මුකුටය (1987 – B)

(5) පහත දැක්වෙන ශාක අතුරින් කවරකට කාබන්ඩයොක්සයිඩ්වලින් කාබොහයිඩ්‍රේට නිපදවිය නොහැකිද?
(1) *Anabaena* (ඇනබිනා) (2) *Loranthus* (ලොරැන්තස්)
(3) *Natrosomonas* (නයිට්‍රොසොමොනාස්) (4) *Pseudomonas* (සියුඩොමොනාස්)
(5) *Utricularia* (යුට්‍රිකියුලේරියා) (1988 – B)

(6) පහත දැක්වෙන ලක්ෂණ අතුරින් කවරක්/කවර ඒවා ආවෘත බීජක ශාක ගොඩබිම ප්‍රමුඛ ලෙස ඇතිරීමට හේතු වූවා විය හැකි ද?
(A) ශුක්‍රාණු ගෙන යන පරාග නලයක් තිබීම. (B) සන්නායක පටකවල විකසනය.
(C) සංවායක පටකවල විකසනය. (D) බීජ හා ඵලවල විකසනය.
(E) පොත්ත විකසනය විම. (1988– B)

(7) විෂමපෝෂී වනුයේ පහත සඳහන් කවර ජීවියා/ජීවින් ද?
(1) *Nitrobacter* (නයිට්‍රොබැක්ටර්) (2) *Drosera* (ඩ්‍රොසෙරා)
(3) *Agaricus* (ඇගරිකස්) (4) *Pseudomonas* (සියුඩොමොනාස්)
(5) Loranthus (ලොරැන්තස්) (1989– B)

(8) ආවෘත බීජකවල සංසේචනය වූ ඩිම්බ සෛලයකින් විකසනය නොවන්නේ පහත සඳහන් ඒවා අතුරෙන් කවරක්ද?
(1) බීජපත්‍රය (2) බීජ මූලය (3) භ්‍රෑණපෝෂය (4) බීජාංකුරය (5) බීජාධාරය
(1990 – B)

(9) ශ්‍රී ලංකාවේ සුලබව දැකිය හැකි පහත සඳහන් ජල ශාක අතුරින් කවරක්/කවර ඒවා ආවෘත බීජකද?
(A) *Eichhornia* (අයිකෝනියා) (B) *Pistia* (පිස්ටියා) (C) *Salvinia* (සැල්විනියා)
(D) *Azolla* (ඇසොල්ලා) (E) *Vallisnaria* (වැලිස්නෙරියා) (1990– B)

(10) පහත සඳහන් ඒවා අතුරින් කවරක්/කවර ඒවා ආවෘත බීජක ශාකවල භෞමික වාසය සඳහා වූ අනුවර්තනයයි සැලකිය නොහැකි ද?
(A) උච්චර්මයක් තිබීම. (B) පරාග කණිකා තිබීම. (C) හරිතලව තිබීම.
(D) සන්ධාරක පටක තිබීම. (E) සනාල පටක තිබීම. (1990– B)

(11) ජීවි රාජධානි තුළ සංඝටකයක් ලෙස කයිටින් අඩංගු වන්නේ,
(1) දෘඩස්තර සෛලවලට ය
(2) වල්ක සෛලවලට ය.
(3) බැක්ටීරියා සෛල බිත්තියෙහි ය.
(4) සයනොබැක්ටීරියා (නීලහරිත) වල සෛල බිත්තියෙහි ය.
(5) බොහෝ දිලීරවල සෛල බිත්තියෙහි ය. (1991 – B)

(12) පහත සඳහන් කාණ්ඩ අතරින් කවරක් වැඩිම ශාක විශේෂ සංඛ්‍යාවක් දරයි ද?
(1) ඇල්ගේ (2) බ්‍රියොපිටා (3) ටෙරිඩොපිටා
(4) විවෘත බීජක (5) ආවෘත බීජක (1992 – B)

(13) ද්විපක්ෂවත් සංයුක්ත පත්‍ර ඇත්තේ පහත සඳහන් ශාක කවරක/කවර ඒවාහිද?
(A) *Delonix* (B) *Mimosa* (C) *Cassia* (D) *Areca* (E) *Ixora* (1992– B)

(14) ශාක භෞමික ජීවිතයකට අනුවර්තනය වීමේ දී පහත සඳහන් ඒවා අතරින් කවරක්/කවර ඒවා අවම ලෙස උපකාරී වන්නට ඇත්ද?
(A) උච්චර්මයක් තිබීම. (B) සනාල පටක තිබීම. (C) සංවායක අවයව (පටක) තිබීම.
(D) අලිංගික ප්‍රජනනය (E) බීජ ඇතිවීම. (1994– B)

(15) Cycas බීජය පිළිබඳ ව පහත සඳහන් ඒවා අතරින් කවරක්/කවර ඒවා භෞමික පරිසරයට අනුවර්තනයක් ලෙස සැලකිය නොහැකි ද?
(A) භ්‍රෑණපෝෂය ඒකගුණක වේ.
(B) පරම්පරා තුනක පටක අඩංගු ය.
(C) බීජචෝලයක් ඇත.
(D) ස්ථර දෙකකින් යුක්ත බීජාවරණයක් ඇත.
(E) සංචිත ආහාරය ප්‍රධාන වශයෙන් ලිපිඩ වේ. (1996– B)

(16) ශාකවල දැකිය හැකි පහත සඳහන් ලක්ෂණ අතරින් කවරක්/කවර ඒවා භෞමික පරිසරයට අනුවර්තනයක් ලෙස සැලකිය නොහැකි ද?
(A) සන්ධාරක පටක තිබීම.
(B) උච්චර්මයක් තිබීම.
(C) හරිතලව තිබීම.
(D) ස්වාධීන ජන්මාණු ශාක හා බීජාණුශාක තිබීම.
(E) සනාල පද්ධතියක් තිබීම. (1996– B)

(17) විෂමබීජාණුක ටෙරිඩොපිටා ශාකයක ජීවන චක්‍රයක පහත දැක්වෙන ව්‍යුහයන් ඇත. මින් කවරක් ආවෘතබීජක ශාකයක ඩිම්බය නියෝජනය කරයි ද?
(1) අණ්ඩාණුධානිය
(2) ජායා ජන්මාණුශාකය
(3) මහාබීජාණුව
(4). මහාබීජාණුධානිය
(5) මහාබීජාණු පත්‍රය (1998– B)

- ප්‍රශ්න අංක 18 සහ 19 පදනම් වී ඇත්තේ ජීවීන් ගණ පහක් පිළිබඳ පහත දී ඇති ලක්ෂණ මතය.

| ලක්ෂණ | ශාක ගනය | | | | |
|---|---|---|---|---|---|
| | A | B | C | D | E |
| සාමාන්‍ය සත්ත්වයන් යටතේ වාසස්ථානය | භෞමික | භෞමික | භෞමික | භෞමික | භෞමික |
| මූල පද්ධතිය | නැත | නැත | ඇත | නැත | ඇත |
| පුෂ්ප | ඇත | නැත | ඇත | නැත | ඇත |
| ස්වයංපෝෂිතයි | ඔව් | ඔව් | ඔව් | ඔව් | ඔව් |
| පරපෝෂී හෝ අර්ධ පරපෝෂී වේ. | ඔව් | නැත | නැත | ඔව් | ඔව් |
| විෂමපෝෂිතයි | නැත | ඔව් | ඔව් | නැත | ඔව් |

(18) ඉහත සඳහන් කවර ගණය *Loranthus* විය හැකි ද?
(1) A (2) B (3) C (4) D (5) E (1998– B)

(19) ඉහත සඳහන් කවර ගණය *Nepenthus* විය හැකි ද?
(1) A (2) B (3) C (4) E (5) D (1998– B)

(20) පහත සඳහන් ඒවායින් කුමක් අඩුම ජල ප්‍රමාණයක් දරයි ද?
(1) හතු
(2) ඇල්ගේ
(3) පරිණත බීජ
(4) කොළ පැහැති පත්‍ර
(5) රබර් ක්ෂීරය. (1998– B)

(21) ආවෘතබීජක ජලශාකවලට පොදු ලක්ෂණයක් ලෙස සැලකිය හැක්කේ පහත සඳහන් ඒවා අතුරෙන් කවරක් ද?
(1) පුටිකා නොමැති බව.
(2) ඡේදනය වූ (බුන්) පත්‍ර පිහිටීම.
(3) පරාගණය ජලය මගින් සිදු වීම.
(4) දිග් වූ පත්‍රවෘන්ත.
(5) ක්ෂීණ වූ සනාල පද්ධතියක් තිබීම. (1999– B)

(22) Pogonatum සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් කවරක් වැරදි වේද?
(1) මූලාභ බහුඓසෙලික වේ.
(2) ශල්ක නැත.
(3) ප්‍රභාසංශ්ලේෂක සූත්‍රිකා විවෘත ය.
(4) අලිංගික ප්‍රජනක දේහ නොමැත.
(5) ප්‍රාක්තන්ත්‍රය ද්විභාජී ශාඛනයක් පෙන්වයි. (1999– B)

(23) පහත දැක්වෙන ශාක කාණ්ඩ අතුරෙන් කවරක් Whittaker (විටෙකර්) සහ තවත් අය ඉදිරිපත් කළ නූතන වර්ගීකරණ පද්ධතියේ ප්ලාන්ටේ රාජධානියට ඇතුළත් නොවන්නේද?
(1) අන්ගියොස්පෙර්මේ
(2) ගිම්නොස්පෙර්මේ
(3) ටෙරිඩොපීටා
(4) බ්‍රියොපීටා
(5) ක්ලෝරොපීටා (1999– B)

(24) පහත ලක්ෂණ අතුරෙන් Dicotyledoneae වර්ගයේ සාමාන්‍ය ලක්ෂණයක් වන්නේ කුමක් ද?
(1) පරිපුෂ්පය, මණිය හා මුකුටය ලෙස විභේදන නොවීම.
(2) විච්ඡේදනය වූ පත්‍ර පිහිටීම.
(3) කඳේ සනාල කලාප විසිරී පිහිටීම.
(4) ජාලාභ නාරටි වින්‍යාසයක් පිහිටීම.
(5) සනාල කැම්බියමක් නොපිහිටීම. (2001)

(25) කරදිය පරිසරයේ ජීවත් වන සතුන්ගේ පහත ලක්ෂණ නිරීක්ෂණය කරන ලදී.
a) සිලින්ඩරාකාර දේහයක් b) ග්‍රාහිකා c) කවචයක් රහිත දේහයක්

මෙම සත්ත්වයා අයත්විය හැක්කේ පහත සඳහන් කුමන වර්ගයටද?
(1) Scaphopoda (2) Echinoidea (3) Holothuroidea
(4) Hirudinea (5) Scyphozoa (2004)

(26) ගෙවත්තක සුන්බුන් අතර සිටි කුඩා කොරපොතු දරන පාද රහිත සත්ත්වයෙක්, ශිෂ්‍යයෙක් විසින් නිරීක්ෂණය කරන ලදී. මෙම සත්ත්වයා බොහෝ විට,
(1) සර්පිල කවචයක් දරන්නෙකු විය හැකිය
(2) දේහ බිත්තියට සවි වූ පේශී සහිත එකෙකු විය හැකිය
(3) ජලජ කීට අවස්ථාවක් සහිත එකෙකු විය හැකිය
(4) අපිචර්මය හරහා ශ්වසනය කරන්නෙකු විය හැකිය
(5) යුරික් අම්ලය බහිස්‍රාවය කරන්නෙකු විය හැකිය (2006)

(27) භෞමික ජීවීන් අන්තර්ගත වනුයේ පහත කුමන තක්සෝනයේද? / තක්සෝනවලද?
(A) Crustacea (B) Chondrichthyes (C) Bryophyta
(D) Cyanobacteria (E) Echinodermata (2006)

(28) පහත දැක්වෙන කුමන වංශයකට *Selaginella* අයත් වේ ද?
(1) ක්ලොරොෆීටා (2) බ්‍රයොෆීටා (3) සයිකඩොෆීටා
(4) ටෙරොෆීටා (5) ලයිසොෆීටා (2008)

(29) පහත සඳහන් ඒවා අතුරෙන් ලයිකොෆයිටාවල දක්නට ලැබෙන නමුත් ටෙරොෆයිටාවල දක්නට නොලැබෙන ලක්ෂණයක් වන්නේ කුමක් ද?
(1) කශිකාධර පුං ජන්මාණු (2) බීජාණු පත්‍රවල උඩ පෘෂ්ඨයට සවි වූ බීජාණුධානි
(3) රයිසෝමයක් ලෙස පිහිටි කඳ (4) සරල ප්‍රාක් තලයක් ලෙස පිහිටි ජන්මාණු ශාකය
(5) ලිග්නීභූත සෛල සහිත සනාල පටක (2010)

(30) ලයිකොෆයිටා කාණ්ඩයේ සාමාජිකයන්,
(1) ජලජ වේ.
(2) ප්‍රභාසංස්ලේෂණය සිදු නොකරන ජන්මාණු ශාක නිපදවයි.
(3) සැමවිටම සමබීජාණුක වේ.
(4) සනාල පටක රහිත වේ.
(5) සංසේචනය සඳහා බාහිර ජලය මත යැපේ. (2011)

(31) ප්ලාන්ටේ රාජධානියේ ලක්ෂණ පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
(1) සෛල බිත්තිවල පෙප්ටිඩොග්ලයිකෑන් හා සෙලියුලෝස් ඇත.
(2) සෛල පටලයේ ඇති ලිපිඩ බොහෝමයක් ශාඛනය වී නැත.
(3) ප්‍රධාන සංචිත ආහාර ද්‍රව්‍ය වනුයේ ග්ලයිකොජන් සහ පිෂ්ටය ය.
(4) ප්‍රෝටීන සංස්ලේෂණය සඳහා ආරම්භක කේතය වන්නේ ෆෝමයිල් මෙතියොනීන් ය.
(5) අනෙකුත් රාජධානිවල ඇති සංචරණ ව්‍යුහ දක්නට ලැබේ. (2012)

(32) තෙත් භෞමික පරිසරවල බහුල ව හමුවන ශාකයක පහත සඳහන් ලක්ෂණ නිරීක්ෂණය කරන ලදී.

(a) සනාල පටකය (b) ප්‍රමුඛ බීජාණුශාකය (c) සංසේචනය සඳහා බාහිර ජලය අවශ්‍ය වීම.
මෙම ශාකය බොහෝවිට අයත් විය හැකි වංශය වන්නේ

(1) බ්‍රයෝෆයිටා ය. (2) ලයිකොෆයිටා ය. (3) සයිකැඩොෆයිටා ය.
(4) කොනිෆෙරොෆයිටා ය. (5) ඇන්තොෆයිටා ය. (2015)

(33) මොනොකොටිලිඩොනේ වර්ගයේ දක්නට නොලැබෙනුයේ පහත සඳහන් කුමන ලක්ෂණය ද?

(1) පරිපුෂ්ප (2) ත්‍රි අංක පුෂ්ප කොටස්
(3) පත්‍රවල සමාන්තර නාරටි වින්‍යාසය (4) මුදුන් මුල් පද්ධතිය
(5) කඳේ සනාල කලාප විසිරී තිබීම (2015)

(34) පහත සඳහන් ඒවා අතුරෙන් කවරක් / කවර ඒවා නිවැරදි ද?

(A) සියලු ම භෞමික ශාකවල සනාල පටක ඇත.
(B) සියලු ම භෞමික ශාක විෂමබීජාණුක වේ.
(C) සියලු ම භෞමික ශාකවල ප්‍රජනක අවයව නිසරු සෛල ස්තරයක් මගින් ආරක්ෂා වේ.
(D) ආවෘතබීජක ශාක හැරුණු විට අන් සියලු ම භෞමික ශාක, ජීවන චක්‍රයේ ද්විත්ව සංසේචනයක් නොදක්වයි.
(E) සියලු ම භෞමික ශාක, භෞමික ජීවිතයට අනුවර්තනයක් ලෙස බීජ නිපදවයි. (2015)

## නිපුණතා මට්ටම 3. 2. 5 : දිලීර

(1) බැක්ටීරියා සෛලයක් *Mucor* (මියුකෝ) බීජාණුවකින් වෙනස් වන්නේ *Mucor* (මියුකෝ) බීජාණුවෙහි,

(A) මයිටොකොන්ඩ්‍රියා ඇති බැවිනි. (B) න්‍යෂ්ටියක් ඇති බැවිනි.
(C) සෛල බිත්තියක් ඇති බැවිනි. (D) ප්‍රවේණි ද්‍රව්‍ය ඇති බැවිනි.
(E) එන්සයිම ඇති බැවිනි. (1986– B)

(2) කලම්ප මග දකිය හැක්කේ,

(1) ඇගැරිකස් *(Agaricus)* හි ද්විතීය දිලීර ජාලයේ ය.
(2) ඇගැරිකස් *(Agaricus)* හි ප්‍රාථමික දිලීර ජාලයේ ය.
(3) එවුරෝටියම් *(Eurotium)* හි අස්කජනක සූත්‍රිකාවල ය.
(4) පයිටොප්තොරා *(Phytopthora)* හි දිලීර ජාලයේ ය.
(5) ස්පයිරොගයිරා *(Spirogyra)* හි පරිණත සූත්‍රිකාවල ය. (1986 – B)

(3) ද්වින්‍යෂ්ටික සෛල ලාක්ෂණිකව දක්නට ලැබෙන්නේ පහත සඳහන් කවරේද?

(A) Agaricus (ඇගැරිකස්) ද්විතීය සූත්‍රිකාවල
(B) Agaricus (ඇගැරිකස්) බැසිඩියමේ බැසිඩි බීජාණු නිපදවීමෙන් අනතුරුව
(C) Agaricus (ඇගැරිකස්) හි ප්‍රාථමික දිලීර ජාලයේ
(D) Allomycel (ඇලෝමයිසල්) හි වර්ධක දිලීර ජාලයේ
(E) Spirogyra (ස්පයිරොගයිරා) හි පරිණත සූත්‍රිකාවල (1987– B)

(4) බැක්ටීරියා සෛල හා දිලීර සෛල සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ අතුරින් කවරක් වැරදිද?

(1) සෛල දෙවර්ගයේම රයිබොසෝම දක්නට ලැබේ.
(2) සෛල දෙවර්ගයේම අනුනන විභාජනය සිදුවිය හැකිය.
(3) සෛල දෙවර්ගයේම සෛල බිත්ති දක්නට ලැබේ.
(4) දිලීර සෛලවල මයිටොකොන්ඩ්‍රියා දක්නට ලැබෙන අතර බැක්ටීරියා සෛලවල මයිටොකොන්ඩ්‍රියා දක්නට නොලැබේ.
(5) දිලීර සෛලවල න්‍යෂ්ටි දක්නට ලැබෙන අතර බැක්ටීරියා සෛලවල න්‍යෂ්ටි දක්නට නොලැබේ. (1988 – B)

(5) *Ascomycetes* (අස්කොමයිසීටේස්) සම්බන්ධයෙන් පහත සඳහන් ඒවා අතුරින් කවරක්/කවර ඒවා වැරදි වේද?
(A) වර්ධක දේහය සැමවිටම ශාඛනය වූ සාවාර දිලීර ජාලයකි.
(B) ලිංගික බීජාණු අන්තර්ජන්‍ය වේ.
(C) ඇතැම් අස්කොමිසේටේස් ඒක සෛලීය වේ.
(D) දිලීර ජාලයෙහි කලම්ප මග ඇත.
(E) අස්කොමිසේටේස්වලට අයත් ඇතැම් ගණ ප්‍රයෝජනවත් ප්‍රතිජීවක නිපදවයි.(1988– B)

(6) වැරදි ප්‍රකාශ/ප්‍රකාශය තෝරන්න.
(A) වයිරස සියල්ල පරපෝෂිත වේ.
(B) දිලීර සියල්ල විෂමපෝෂී වේ.
(C) එන්සයිම සියල්ල තාප අස්ථායි වේ.
(D) හෝර්මෝන සියල්ල ප්‍රෝටීන වේ.
(E) බීජ ශාක සියල්ල ස්වයංපෝෂී වේ.
(1989– B)

(7) නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) කොනිඩිවල කශිකා තිබිය හැකිය.
(2) අස්ක බීජාණු බහිර්ජන්‍ය ලෙස නිපදේ.
(3) බැසිඩි බීජාණු ප්‍රරෝහණය වීමෙන් ද්විතීයික දිලීර ජාල ඇති වේ.
(4) සංයෝගාණු ඇති වන්නේ රූපීයව සමාන ජන්මාණුධානි හාවීමෙනි.
(5) *Mucor* (මියුකෝර්) බීජාණුධානිය තුළ චල බීජාණු ඇති වේ. (1990 – B)

(8) *Saccharomyces* පිළිබඳව පහත දැක්වෙන ප්‍රකාශ අතරින් කවරක් වැරදිද?
(1) පාන් සෑදීම සඳහා එය උපයෝගී වේ.
(2) එය වෛකල්පිත නිර්වායු ශ්වසන ජීවියකි.
(3) එහි සාමාන්‍ය ප්‍රජනන ක්‍රමය අංකුරනයයි.
(4) යෝගට් නිෂ්පාදනය සඳහා එය වැදගත් වේ.
(5) එය සුන්‍යෂ්ටික ජීවියෙකි. (1991 – B)

- 9 හා 10 ප්‍රශ්න සිට දක්වා වන ගණ මත පදනම් වේ.
A. *Saccharomyces* B. *Aspergillus* C. *Clostridium*
D. *Agaricus* E. *Pinnularia*

(9) ඉහත සඳහන් ජීවීන්ගෙන් කුමක් බහිස්සෛලීය එන්සයිම ස්‍රාවය කරයිද?
(1) A පමණි (2) A හා B පමණි (3) A, B හා C පමණි
(4) A,B,C හා D පමණි (5) A,B,C,D හා E පමණි (1991 – B)

(10) ඉහත සඳහන් ජීවීන්ගෙන් කවරකට ස්වායු තත්ත්වයන් යටතේ ජීවත් විය නොහැකිද?
(1) A පමණි (2) B හා C පමණි (3) C පමණි
(4) A හා C පමණි (5) A හා E පමණි (1991 – B)

(11) බහිස්සෛලීය එන්සයිම නිෂ්පාදනය කරන්නේ පහත සඳහන් ඒවා අතරින් කවරක්/කවර ඒවාද?
(A) *Mucor* (B) *Penicillium* (C) *Chlamydomonas*
(D) *Saccharomyces* (E) *Anabaena* (1992– B)

(12) සෛල බිත්තියේ සෙලියුලෝස් නොමැත්තේ,
(A) *Anabaena* (B) *Pinnularia* (C) *Aspergillus*
(D) *Rhizobium* (D) *Closterium* (1993– B)

(13) පහත සඳහන් ප්‍රකාශන අතරින් කවරක්/කවර ඒවා වැරදිද?
(A) වෛරස සියල්ලම අනිවාර්ය පරපෝෂිතයන්ය.
(B) දිලීර සියල්ලම විෂමපෝෂීන් ය.
(C) බැක්ටීරියා සියල්ලම විෂමපෝෂීන් ය.
(D) දිලීර සියල්ලම මෘතෝපජීවීන්ය.
(E) ඇල්ගේ සියල්ලම ස්වයංපෝෂීන්ය. (1994– B)

(14) පහත දැක්වෙන ප්‍රකාශ අතරින් කවරක් නිවැරදිද?
(1) ඇස්කබීජාණු බහිර්ජන්‍ය ලෙස බිහි වේ.
(2) *Aspergillus* වල ජන්මාණු නිපදවයි.
(3) බැසිඩිබීජාණු ප්‍රරෝහණයෙන් ද්විතියික දිලීර ජාලය බිහි වේ.
(4) *Allomyces / Chytridim* වල ප්‍රජනක සෛල බිහි කරයි.
(5) බැසිඩිබීජාණු බැසිඩියම තුළ ඇති වේ. (1996 – B)

(15) බැසිඩියොමිසේටේ ගැන පහත දැක්වෙන ප්‍රකාශ අතරින් කවරක් වැරදිද?
(1) වර්ධක දිලීර ජාලය ආවාර සහිතව අතු බෙදී ඇත.
(2) ද්විතියික දිලීර ජාල ද්වින්‍යෂ්ටිකය.
(3) මෙම කාණ්ඩයේ ඇතැම් සාමාජිකයින් දුව දිරාපත් කිරීමෙහි වැදගත් කාර්යයක් ඉටු කරයි.
(4) ද්විතියික දිලීර ජාලයෙහි පමණක් කලම්ප මග ඇත.
(5) ලිංගික බීජාණු අන්තර්ජන්‍ය වේ. (1995 – B)

(16) වෛරස දිලීරවලින් වෙනස් වන්නේ ඒවා,
(1) ලිංගික ප්‍රජනනයක් නොපෙන්වන නිසා ය.
(2) අනිවාර්ය පරපෝෂිතයින් නිසා ය.
(3) පියවි ඇසට නොපෙනෙන නිසා ය.
(4) ක්‍රියාකාරීත්වයට හානි නොවන සේ ස්ඵටිකරණය කළ හැකි නිසා ය.
(5) ධාරක විශිෂ්ටත්වය පෙන්වන නිසා ය. (1996 – B)

(17) පහත සඳහන් ප්‍රකාශ අතුරින් කවරක්/කවර ඒවා ඇස්කොමයිසීට (Ascomycete) සම්බන්ධයෙන් නිවැරදිද?
(1) වර්ධක අවස්ථා සැමවිට ම නිරාවාර ශාකනය වූ සූත්‍රිකාවලින් යුක්ත වේ.
(2) ලිංගික බීජාණු බහිර් ජන්‍ය වේ.
(3) අලිංගික බීජාණු බහිර් ජන්‍ය වේ.
(4) සමහර සාමාජිකයන් ඒකසෛලික වේ.
(5) සූත්‍රිකාවල කලම්ප මං දක්නට ඇත. (1997– B)

(18) *Agaricus* වල ද්විතියික දිලීර ජාලයේ ආවාරවලින් සීමා වූ සෑම ඛණ්ඩයක ම ඇත්තේ
(1) සර්වසම ඒකගුණ න්‍යෂ්ටි යුගලයකි.
(2) සර්වසම ද්විගුණ න්‍යෂ්ටි යුගලයකි.
(3) ලිංගිකව එකිනෙකට ගැලපෙන ඒකගුණ න්‍යෂ්ටි යුගලයකි.
(4) එක් ඒකගුණ න්‍යෂ්ටියකි.
(5) එක් ද්විගුණ න්‍යෂ්ටියකි. (1998– B)

පහත ප්‍රශ්නය පහත සඳහන් දත්තයන් මත පදනම් වී ඇත. යම් වාසස්ථානයක ජීවීන් 5 ක ඇස්තමේන්තු කරන ලද සංඛ්‍යාවන් පහත දී ඇත.

| ජීවියා | ඇස්තමේන්තු කරන ලද සංඛ්‍යාව |
|---|---|
| P | 120 |
| Q | 1300 |
| R | 4 |
| S | 350 |
| T | 25 |

(19) පහත සඳහන් කවර ජීවීන්ට/ජීවී සමූහයකට Q හා සමාන කාර්යභාරයක් තිබේද?
(a). Nitrosomonas (b). ඇල්ගේ (c). පාසි (d). දිලීර

(1) a සහ b පමණයි (2) a පමණයි (3) a, b සහ c පමණයි
(4) b සහ c පමණයි (5) a සහ d පමණයි (1998– B)

(20) පහත සඳහන් කවරක් දිලීරයක දර්ශීය ගුණාංගයක් නොවේද?
(1) මොවුන් සූත්‍රිකාමය වේ.
(2) සූන්‍යෂ්ටික සෛල සංවිධානයක් ඇත.
(3) මොවුන් බාහිර පරිසරයෙන් පෝෂක ලබා ගනී.
(4) මොවුන්ට සෛල බිත්ති ඇත.
(5) මොවුන් අනිවාර්ය නිර්වායු ජීවීන් ය. (1998– B)

(21) පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් කවරක් වැරදි ද?
(1) *Mucor* වල සංයෝගාණුව තුළ න්‍යෂ්ටි රාශියක් යුගල ලෙස සංයෝජනය වේ.
(2) *Saccharomyces* වල අස්කනය තුළ බීජාණු අටක් ඇති වේ.
(3) *Aspergillus* හි ද්විත්‍යෂ්ටික දිලීර ජාලයේ කොනිඩි බීජාණු ඇති වේ.
(4) *Phytopthora* හි බීජාණුධානියට කොනිඩියමක් සේ ක්‍රියා කළ හැකිය.
(5) *Agaricus* වල න්‍යෂ්ටියෝගය සිදු වූ ඉක්මනින් ම ඌනන විභාජනය සිදු වේ.(1999– B)

(22) දිලීර බැක්ටීරියාවලින් වෙනස් වනුයේ දිලීර,
(1) මෘතෝපජීවී බැවිනි
(2) අවශෝෂක පෝෂණයක් දක්වන බැවිනි.
(3) ප්‍රතිජීවක නිපදවන බැවිනි
(4) සූන්‍යෂ්ටික බැවිනි.
(5) අලිංගික ලෙස ප්‍රජනනය කරන බැවිනි. (2000)

(23) දිලීර පිළිබඳ පහත සඳහන් ඒවා අතුරෙන් කවරක් නිවැරදි ද?
1) බීජාණු නිපදවන්නේ අලිංගික ප්‍රජනනයේ දී පමණි.
2) ද්විගුණ අවස්ථාව වර්ධක කලාව මගින් නිරූපණය කෙරේ.
3) විෂමතලසතාව සුලබ ව දැකිය හැකි ය.
4) ප්‍රජනනයේ දී සෛල ප්ලාස්මයේ සංයෝජනය හා න්‍යෂ්ටිවල සංයෝජනය එකවර සිදු වේ.
5) ප්‍රජනනයේ දී කශිකාධර සෛල ඇති වේ. (2001)

(24) පහත සඳහන් ඒවා අතුරෙන් කවරක් වැරදි ද?
1) සියලු ම සයනොබැක්ටීරියා, ප්‍රභාස්වයංපෝෂීන් වේ.
2) සියලු ම වෛරස පරපෝෂීන් වේ.
3) සියලු ම බැක්ටීරියා රසායනික ස්වයංපෝෂීන් නොවේ.
4) සියලු ම දිලීර සූත්‍රිකාමය නොවේ.
5) සියලු ම බැක්ටීරියා ද්විඛණ්ඩනයෙන් ප්‍රජනනය කරයි. (2010)

(25) දිලීරවල ලාක්ෂණික ගුණයක් වන්නේ,
1) ග්ලයිකොපෙප්ටයිඩවලින් තැනුන සෛල බිත්ති තිබීමයි.
2) විෂමපෝෂී අවශෝෂණ පෝෂණයක් තිබීමයි.
3) ආහාර අධිග්‍රහණය කර ජීරණය කිරීමයි.
4) ආහාර පිෂ්ටය ලෙස තැන්පත් කිරීමයි.
5) අන්තඃබීජාණු මගින් ප්‍රජනනය කිරීමයි. (2018)

**නිපුණතාව 3. 2. 6 : සත්ත්ව රාජධානිය**
**බාහිර ලක්ෂණ අනුව ජීවීන් වර්ග හඳුනා ගැනීම**
**3. 2. 7 : කෝඩේටා වංශය**

(1) මිනිසාගේ විද්‍යාත්මක නාමය ලියන නිවැරදි ක්‍රමය පහත සඳහන් කවරක්ද?
(1) *Homo Sapiens sapiens*
(2) *Homo Sapiens Sapiens*
(3) *Homo sapiens sapiens*
(4) Homo sapiens sapiens
(5) *homo sapiens sapiens* (1986 - Z)

(2) පහත සඳහන් කවරෙකු ඩ්‍යුටෙරොස්ටෝමයෙකු වන්නේ ද?
(1) ඔලිගොකේටා
(2) පොලිකීටා
(3) ගොළුබෙල්ලා
(4) කැරපොත්තා
(5) ඉකිරියා (1986 - Z)

(3) පහත සඳහන් Phyla අතුරෙන් සම්පූර්ණයෙන්ම මුහුදු වාසීන් අඩංගු වන්නේ කවරකද?
(1) Porifera (2) Coelenterata (3) Platyhelminthes
(4) Mollusca (5) Echinodermata (1986 - Z)

(4) හිස, උරස හා උදරයය යන කොටස්වලට ශරීරය බෙදී ඇත්තේ පහත දක්වෙන කුමන සතුන්ගේද?
(1) කෘමීන් හා හැකරැල්ලන් (2) පත්තෑයන් හා ඉස්සන්
(3) මකුළුවන් හා ගෝනුස්සන් (4) පොලිකීටාවන් හා ගැඩවිලුන්
(5) ගොළුබෙල්ලන් හා දැල්ලන් (1986 - Z)

(5) උපස්ථරයකට ස්ථිරව සවි වූ සතුන් ඇතුළත් නොවන්නේ පහත සඳහන් කිනම් Phylum වද?
(1) Coelenterata (2) Mollusca (3) Echinodermata
(4) Nematoda (5) Arthropoda (1986 - Z)

(6) හොඳින් විකසනය වූ සීලෝමයක් සහිත සතුන් ඇතුළත් වන්නේ පහත සඳහන් කුමකටද?
(1) Arthropoda (2) Annelida (3) Echinodermata
(4) Platyhelminthes (5) Nematoda (1986 - Z)

(7) ප්‍රොටෝස්ටෝම් සතුන්
(1) අතර බණ්ඩනයක් හෝ සීලෝමයක් නොතිබේ.
(2) යටතේ සිලෙන්ටරාටාවන් සහ ඉස්පන්ජ් ද ඇතුළත් කර ඇත.
(3) ඩියුටෙරොස්ටෝමාවන්ට වඩා බහුලතාවයෙන් අඩු වේ.
(4) ඩියුටෙරොස්ටෝමාවන්ට වඩා වෙනස් විකසන රටාවක් පෙන්වත්.
(5) අතර කීටයන් නැත. (1987 - Z)

- 8, 9 සහ 10 වැනි ප්‍රශ්න පහත සඳහන් සතුන් මත පදනම් වී තිබේ.
(a) කෘමීන් (b) මකුළුවන් (c) ක්‍රැස්ටාසෙයාවන්
(d) පත්තෑයින් (e) හැකරැල්ලන්

(8) අධෝහනු නැත්තේ කවර සතුන්ටද?
(1) a (2) b (3) c (4) d (5) e

(9) ස්පර්ශක යුගල් දෙකක් ඇත්තේ කුමන සතුන්ටද?
(1) a (2) b (3) c (4) d (5) e

(10) භෞමික සතුන් සංඛ්‍යාවක් අඩංගු වුවද වැඩි වශයෙන් ම ජලජ වන්නේ මෙවායින් කිනම් කාණ්ඩයද?
(1) a (2) b (3) c (4) d (5) e (1987 - Z)

(11) පහත දක්වෙන කාණ්ඩ අතුරින් මිරිදියෙහි නියෝජිතයන් නොමැති එක වන්නේ
(1) Coelenterata (2) Porifera (3) Echinodermata
(4) Nematoda (5) Annelida (1988 - Z)

(12) පහත සඳහන් කාණ්ඩවලින් එකකට අයිති species සියල්ලක්ම ස්ථිරව උපස්ථරයකට සවි වී තිබේ. කාණ්ඩය නම්
(1) Coelenterata (2) Porifera (3) Annelida (4) Mollusca (5) Echinodermata
(1988 - Z)

(13) ග්‍රන්ථි රහිත හෝ සුළු වශයෙන් ග්‍රන්ථි සහිත කොරලමය චර්මයක් විශිෂ්ඨ ලක්ෂණයක් වනුයේ,
(1) මත්ස්‍යයන්ගේය (2) උරගයන්ගේය (3) පක්ෂීන්ගේය.
(4) චවුලන්ගේය. (5) තල්මසුන්ගේය. (1988 - Z)

(14) පහත සඳහන් ලක්ෂණ අතුරින් එයට ඉදිරිපිට දක්වා ඇති කාණ්ඩය වෙන්කොට හඳුනාගත හැකි ලක්ෂණය නොවන්නේ කුමක්ද?
(1) අරීය සමමිතිය - Echinodermata
(2) කුහරමය ස්නායු රජ්ජුව - Chordata
(3) කයිටිනීය උච්චර්මය - Arthropoda
(4) රේත්‍රිකාව - Mollusca
(5) දංශක කෝෂ්ඨ - Coelenterata
(1988 - Z)

(15) පහත සඳහන් ඒවායින් පක්ෂ්ම හමු නොවන්නේ කුමන ඒකේද?
(1) Annelida (2) Arthropoda (3) Echinodermata
(4) Mollusca (5) Platyhelminthes
(1989 - Z)

(16) දංශක කෝෂ්ඨ හමු වන්නේ
(1) Annelida (2) Coelenterata (3) Mollusca (4) Nematoda (5) Platyhelminthes
(1989 - Z)

(17) පහත සඳහන් Arthropoda වර්ග අතුරෙන් ස්පර්ශක දක්නට නොලැබෙන්නේ කුමන වර්ගයේ ද?
(1) Insecta (2) Crustacea (3) Chilopoda (4) Diplopoda (5) Arachnida
(1989- Z)

(18) පරපෝෂිතයන් පමණක් අඩංගු- වන්නේ පහත සඳහන් කුමන කාණ්ඩයේද?
(1) Asteroidea (2) Gastropoda (3) Nematoda
(4) Polychaeta (5) Trematoda
(1989- Z)

• 19, 20, සහ 21 වැනි ප්‍රශ්න පහත සඳහන් ක්ෂීරපායි ගොත්‍ර මත පදනම් වී තිබේ.
(A) Primates (B) Chiroptera (C) Perissodactyla (D) Cetacea (E) Artiodactyla

(19) ඉහත සඳහන් ක්ෂිරපායි ගෝත්‍ර අතුරින් අධි වේගයෙන් දිවීම සඳහා හොඳින් අනුවර්තනය වී ඇති සතුන් අඩංගු වනුයේ
(1) A (2) B (3) C (4) D (5) E.

(20) ඉහත සඳහන් ක්ෂීරපායි ගෝත්‍ර අතුරින් ද්විනේත්‍රික දෘෂ්ටිය විකසනය වී ඇති සතුන් ඇතුළත් වී ඇත්තේ,
(1) A (2) B (3) C (4) D (5) E

(21) මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය රටට විශාල වාසි ගෙන දෙයි. එසේ වුවද වන සතුන්ට හානියක් සිදුවිය හැකියි. පහත සඳහන් සතුන් අතරින් වැඩියෙන්ම බලපෑමක් ඇති විය හැකි වනුයේ,
(1) කිඹුලන්ටය. (2) මී හරකුන්ටය. (3) වල් ඌරන්ටය.
(4) අලින්ටය. (5) වඳුරන්ටය.
(1989- Z)

(22) කලලයක් ලෙස කෙලින්ම විකසනය වන්නේ පහත සඳහන් කවරකද?
(1) අණ්ඩය (2) ශුක්‍රාණුව (3) යුක්තාණුව (4) බීජාණුව (5) බීජාණු මාතෘ සෛලය
(1989 – B)

(23) මිනිසා,
(1) ද්විනේත්‍රික දෘෂ්ටිය සහිත (2) කථා කිරීමේ හැකියාව ඇති
(3) අත්පාවල ඇඟිලිවල පැතලි නිය සහිත (4) ආයුධ භාවිත කිරීමේ හැකියාව ඇති
(5) වලිගයක් රහිත එකම ප්‍රිමාටේවාය.
(1990- Z)

(24) සත්ත්ව වර්ගීකරණය,
(1) ප්‍රධාන වශයෙන්, අධ්‍යයනය කිරීමේ පහසුව සඳහා කරනු ලැබේ.
(2) හඳුනා ගැනීම සඳහා යතුරු සෑදීමට උපකාරි වේ.
(3) සත්ත්ව විද්‍යාවෙහි වැදගත් අංශයක් නොවේ.
(4) වංශප්‍රවේණික බන්ධුතා දක්වීමට උපකාරි වේ.
(5) ශාක වර්ගීකරණය සඳහා උපයෝගී වන මූලධර්මවලින් වෙනස් වේ.
(1990- Z)

(25) පහත සඳහන් ලක්ෂණ අතුරින් උරගයින්ට භෞමික අනුවර්තනයක් ලෙස අත්‍යවශ්‍ය නොවන්නේ කුමන ලක්ෂණය ද?
(1) වියළි කොරලමය හම (2) වලිගය (3) යූරික් අම්ලය බහිස්‍රාවීය ඵලයක් වීම
(4) පෙනහැලි (5) පටල සහ කවචයකින් යුත් බිත්තරය (1990- Z)

(26) පහත සඳහන් ලක්ෂණ අතුරින් පත්තෑයකු සහ හැකරැල්ලකු අතර වූ වෙනස්කමක් නොවන්නේ කවර ලක්ෂණය ද?
(1) දේහයේ පෙදෙස් (2) එක් ඛණ්ඩයක පිහිටි ගාත්‍රා ගණන (3) ශරීරයෙහි හැඩය
(4) ඛණ්ඩනය (5) ප්‍රජනක විවර පිහිටි ස්ථානය (1990- Z)

(27) පහත සඳහන් කාණ්ඩ අතුරින් සීලෝමය හා ඛණ්ඩනය යන දෙකම දක්නට ලැබෙන්නේ කුමන කාණ්ඩයෙහි ද?
(1) Annelida (2) Coelenterata (3) Nematoda (4) Turbellaria (5) Cestoda (1990- Z)

(28) නාල පාද,
(1) Annelida (2) Mollusca (3) Coelenterata
(4) Platyhelminthes (5) Echinodermata වන්ගේ පමණක් දක්නට ලැබෙන සංචරණ ව්‍යුහයන්ය. (1990- Z)

(29) මධ්‍යශ්ලේෂය ආවේණික ස්තරයක් වන්නේ,
(1) Annelida (2) Coelenterata (3) Mollusca
(4) Nematoda (5) Platyhelminthes වන්ගේය. (1990- Z)

(30) පහත සඳහන් ලක්ෂණ අතුරින් පක්ෂීන් සහ සජීවී උරගයින් යන දෙකොට්ඨාශයේම දක්නට ලැබෙන්නේ කුමන ලක්ෂණය ද?
(1) පිහාටු (2) හොට (3) පියාපත (4) වියළි සම (5) ද්විපාද විලාසය (1990- Z)

- ප්‍රශ්න අංක 31 හා 32 පහත සඳහන් වංශ වත පදනම් වී ඇත.
A – Chordata B – Echinodermata C – Mollusca
D – Platyhelminthes E – Annelida

(31) අභ්‍යන්තර කංකාල ව්‍යුහ දක්නට නොලැබෙන්නේ,
(1) A සහ B ගේය. (2) B සහ C ගේය. (3) C සහ D ගේය.
(4) D සහ E ගේය. (5) A සහ E ගේය. (1991- Z)

(32) හොඳින් විකසනය වූ සීලෝමයක් තිබෙන්නේ,
(1) A සහ B ගේය. (2) B සහ C ගේය. (3) C සහ D ගේය.
(4) D සහ E ගේය. (5) A සහ E ගේය. (1991- Z)

(33) පහත සඳහන් කාණ්ඩ අතරෙන් භෞමික සත්ත්වයින් පමණක් අන්තර්ගත වන්නේ කුමන කාණ්ඩයටද?
(1) Turbellaria (2) Chilopoda (3) Gastropoda
(4) Insecta (5) Oligochaeta (1991- Z)

(34) මත්ස්‍යයින්ගේ පහත සඳහන් ලක්ෂණ අතරෙන් ජලීය ජීවිතයකට කෙලින්ම සම්බන්ධ නොවන්නේ කුමක්ද?
(1) දේහයෙහි හැඩය (2) ජලක්ලෝම (3) සඟල වරල්
(4) චර්මීය කොරළ (5) ශ්ලේෂ්මල ග්‍රන්ථි (1991- Z)

(35) පහත සඳහන් ලක්ෂණ අතරෙන් උරගයින් සහ පක්ෂීන් යන දෙකොට්ඨාශටම අයත් ලක්ෂණයක් නොවන්නේ කුමක් ද?
(1) කවචයකින් වට වූ බිත්තර දැමීම. (2) සම වියළි නමුත් විශේෂ ග්‍රන්ථි දැරීම.
(3) දේහයෙහි කුමන කොටසක හෝ කොරළ පිහිටීම. (4) අපර ගාත්‍රාවල කබර තිබීම.
(5) සැකිල්ල සැහැල්ලු වීම. (1991- Z)

(36) පහත සඳහන් කාණ්ඩ අතරෙන් ජීවී විශේෂ වැඩිම සංඛ්‍යාවක් අයත් වන කාණ්ඩය කුමක්ද?
(1) පක්ෂීන් (2) කෘමීන් (3) මත්ස්‍යයින්
(4) ප්‍රෝටසෝවාවන් (5) මොලුස්කාවන්. (1991- Z)

(37) බහුසෛලික සත්ත්වයෙකුගේ සියලුම දෛහික සෛලයන්ට සර්වසම,
(1) අභ්‍යන්තර පරිසර ඇත. (2) බහුඛණ්ඩනය වන විලාශ ඇත.
(3) පුනර්වර්ධන හැකියාවක් ඇත. (4) ඉන්ද්‍රිකා සංඛ්‍යාවක් ඇත.
(5) ප්‍රවේණික සංයුතියක් ඇත. (1992- Z)

(38) පහත සඳහන් වර්ගීකරණ කාණ්ඩ අතරෙන් එකිනෙකට ඉතා කිට්ටු සමානතාවක් සහිත සත්ත්වයන් අයත් වන්නේ කුමන කාණ්ඩයටද?
(1) Plylum (2) Sub-species (3) Family (4) Order (5) Species (1992- Z)

(39) Chordata වන් වෙනත් Plylum එකක් හෝ වැඩි ගණනක් සමඟ පොදුවේ පෙන්නුම් කරන්නේ පහත සඳහන් කුමන ලක්ෂණයද?
(1) සත්‍ය වෘක්කය (2) උදරීය හෘදය (3) අස්ථිමය හනු
(4) පශ්ච ගුද වලිගය (5) අභ්‍යන්තර සැකිල්ල (1992- Z)

(40) පහත සඳහන් වගන්ති අතරෙන් වැරදි වගන්තිය කුමක්ද?
(1) Annelida ගේ බහිස්‍රාවී අවයවය වෘක්කිකාවය.
(2) Platyhelminthes හි නිදැල්ලේ වෙසෙන ආකාරයන්ද අයත්ය.
(3) Nematoda වන්ගේ දේහ කුහරය ව්‍යාජ සීලෝමයකි.
(4) විශාලතම අපෘෂ්ඨවංශී සත්ත්වයා දක්නට ලැබෙන්නේ Echinodermata වන් අතරේය.
(5) Sporozoa වන්ට අයත්වන්නේ පරපෝෂී සත්ත්වයින් පමණකි. (1992- Z)

(41) පහත දක්නට ඇති ලක්ෂණ අතරෙන් සත්ත්ව වංශ වැඩිම සංඛ්‍යාවක දක්නට ලැබෙන්නේ කුමන ලක්ෂණයද?
(1) ඛණ්ඩනය (2) අරීය සමමිතිය (3) පක්ෂ්මධර කීටයන්
(4) වෘක්කිකා (5) ජලක්ලෝම (1992- Z)

(42) විශාලම විවිධත්වයක් පෙන්නුම් කරන සත්ත්ව Phylum එක වන්නේ
(1) Chordata (2) Mollusca (3) Nematoda
(4) Platyhelminthes (5) Arthropoda (1992- Z)

(43) Class Insecta වෙනත් Arthropoda Classes වලින් වෙන්කොට හඳුනාගත හැකි වනුයේ, කෘමීන්
(1) ස්පර්ශක යුගල දෙකක් සහ උපාංග සහිත උදරයක් දරණ නිසාය.
(2) ස්පර්ශක යුගලක් සහ උපාංග රහිත උදරයක් දරණ නිසාය.
(3) ස්පර්ශක රහිත වී උපාංග රහිත උදරයක් දරණ නිසාය.
(4) ස්පර්ශක යුගලයක් සහ සෑම දේහ ඛණ්ඩයකම උපාංග යුගල දෙකක් දරණ නිසාය.
(5) ස්පර්ශක යුගලයක් සහ සෑම දේහ ඛණ්ඩයකම උපාංග යුගලක් දරණ නිසාය.(1993- Z)

(44) පහත සඳහන් වගන්ති අතරෙන් වැරදි වනුයේ කුමක්ද?
(1) සියලුම Sporozoa වන් පරපෝෂිතය.
(2) Platyhelminthes ද්විප්‍රස්තර සත්ත්වයින්ය.
(3) Coelenterata ද්විප්‍රස්තර සත්ත්වයින්ය.
(4) සියලු වංශ අතරෙන් වැඩිම විශේෂ සංඛ්‍යාවක් අයත් වන්නේ Arthropodaටය.
(5) ට්‍රොකපෝර් කීටයා ඩියුටෙරොස්ටෝමියාවන්ගේ දක්නට ලැබේ. (1993- Z)

(45) පහත සඳහන් ඒවා අතරෙන් Phylum Mollusca ට පමණක් සීමා වූ ලක්ෂණය කුමක්ද?
(1) හිස, පේශිමය පාදය සහ අන්තරංග ගොනුව සහිත මෘදු දේහය
(2) සීලෝමය විශාල වශයෙන් රුධිරහෙබ මගින් ප්‍රතිස්ථාපනය වී තිබීම.
(3) චූර්ණමය බාහිර කවචය.
(4) ජලක්ලෝම තිබීම.
(5) ද්විලිංගිකතාව (1993- Z)

(46) උරගයින්ගේ පහත සඳහන් ලක්ෂණ අතරෙන් කවරක් භෞමික ජීවිතයක් සඳහා වූ අනුවර්තනයක් ලෙස සැලකිය නොහැකි වේද?
(1) රුධිර වර්ණකය ලෙස හිමොග්ලොබින් තිබීම. (2) කවචයකින් ආවරණය වූ බිත්තරය
(3) පිරිමි සතුන්ගේ ශිෂ්නයක් තිබීම. (4) ප්‍රධාන බහිස්‍රාවී ඵලය යූරික් අම්ලය වීම.
(5) පංචාංගුලික ගාත්‍රා තිබීම. (1993- Z)

(47) පහත සඳහන් වගන්ති අතරෙන් Class Aves පිළිබඳ අසත්‍ය වනුයේ කුමක්ද?
(1) පියාසර කිරීමට හැකියාවක් දක්වන එකම පෘෂ්ඨවංශී කාණ්ඩය මොවුන්ය.
(2) ඔව්හු කොරළ සහ පිහාටු යන දෙකම දරත්
(3) ඔවුන්ගේ හනු දත් නොදරයි.
(4) ඔවුන්ගේ අස්ථි වැඩි ප්‍රමාණයක් කුහරමය වේ.
(5) විශේෂ පිහාටු කාණ්ඩයක් පියාපතෙහි පෘෂ්ඨය සාදයි. (1993- Z)

(48) Cetacea ගේ පහත සඳහන් ලක්ෂණ අතරෙන් ජලජ ජීවිතයක් සඳහා වැඩියන්ම වැදගත් වනුයේ කුමක්ද?
(1) පිටතට පෙනෙන අපර ගාත්‍රා නොමැති වීම. (2) පැටවුන්ට කිරි දීම.
(3) පෘෂ්ඨෝදරියව පැතලි වලිගය. (4) ග්‍රෛවී කශේරුකා හත
(5) පෙනහලු තිබීම. (1993- Z)

(49) කෘමින්ගේ දක්නට ලැබෙන පහත සඳහන් ලක්ෂණ අතරෙන් ක්‍රස්ටේසියාවන්ගේ දක්නට නොලැබෙන්නේ කුමක් ද?
(1) කයිටිනීය පිටසැකිල්ල (2) මැල්පිගීය නාලිකා (3) ටැග්මීකරණය
(4) ස්පර්ශක (5) සංයුක්ත අක්ෂි (1994- Z)

(50) වර්ගීකරණයේ දී වඩාත් ම සමීප බන්ධුතාවක් දක්වන සතුන් කාණ්ඩ කර ඇත්තේ.
(1) Phylum යටතේ ය. (2) Class යටතේ ය. (3) Order යටතේ ය.
(4) Family යටතේ ය. (5) Genus යටතේ ය. (1994- Z)

(51) මිරිදිය ආකාර අන්තර්ගත නොවන්නේ පහත සඳහන් කුමන වංශයෙහි ද?
(1) Coelenterata (2) Echinodermata (3) Chordata
(4) Mollusca (5) Annelida (1994- Z)

(52) පහත සඳහන් වගන්ති අතරෙන් සත්ත්ව රාජධානිය පිළිබඳ අසත්‍ය වනුයේ කුමක් ද?
(1) මුලින්ම ශීර්ෂණයක් පෙන්නුම් කළේ ප්ලැටිහෙල්මින්තේසයන් ය.
(2) සීලෙන්ටරේටාවන් අතර පරපෝෂිත ආකාර නොමැත.
(3) මුලින්ම වෘක්කිකා විකසනය වූයේ ඇනලිඩාවන්ගේ ය.
(4) රේත්‍රිකාව මොලස්කාවන්ට පමණක් සීමා වේ.
(5) පංචඅරීය සමමිතිය එකයිනොඩර්මේටාවන්ගේ ආවේණික ලක්ෂණයකි. (1995- Z)

(53) Reptilia වර්ගයෙහි කිසිම සාමාජිකයකුගේ දක්නට නොලැබෙන්නේ පහත සඳහන් ඒවායින් කුමක්ද?
(1) තෙත් සමක් (2) කලලාවාරික බිත්තරයක්
(3) කුටීර හතරකින් යුත් හෘදයක් (4) අස්ථිමය කවචයක්
(5) සංසර්ග අවයවයක් (1995- Z)

(54) පහත සඳහන් වංශ අතරෙන් පිටසැකිල්ලක් සහිත සාමාජිකයන් අන්තර්ගත නොවන්නේ කුමකටද?
(1) Coelenterata (2) Arthropoda (3) Mollusca
(4) Echinodermata (5) Chordata (1995- Z)

(55) පහත සඳහන් අවයව පද්ධති අතරෙන් සත්ත්ව රාජධානිය තුළ අන්තිමය ඇති වූ අවයව පද්ධතිය කුමක්ද?
(1) පේශි පද්ධතිය (2) ශ්වසන පද්ධතිය (3) ප්‍රජනන පද්ධතිය
(4) සංසරණ පද්ධතිය (5) බහිස්ස්‍රාවී පද්ධතිය (1995- Z)

(56) යකඩ සහිත ශ්වසන වර්ණකයක් දිය වූ රුධිර ප්ලාස්මයක් ඇත්තේ
(1) ක්‍රස්ටේසියාවන්ට ය. (2) ඇනලීඩාවන්ට ය. (3) උභයජීවීන්ට ය.
(4) පක්ෂීන්ට ය. (5) උරගයන්ට ය. (1996- Z)

(57) පක්ෂීන්ගේ පියාසැරිය සඳහා අඩුවෙන් ම වැදගත් වන ලක්ෂණය වනුයේ,
(1) බිත්තර දැමීමේ පුරුද්ද ය. (2) වායවමය වූ අස්ථි තිබීම ය.
(3) උරතලයේ නෞතලයක් විකසනය වීම ය. (4) න්‍යෂ්ටි සහිත රක්තාණු තිබීම ය.
(5) මුත්‍රාශයක් නොතිබීම ය. (1996- Z)

(58) පහත සඳහන් ඒවා අතරෙන් උරගයින්ගේ දක්නට ලැබෙන ලක්ෂණයක් වනුයේ කුමක්ද?
(1) අපර කපාල සන්ධාන් අග්‍ර දෙක (2) කපාල ස්නායු යුගල දොළහ
(3) කර්ණ අස්ථිකා තුන (4) තනි සංස්ථානික චක්‍රය
(5) රූපාන්තරණය (1996- Z)

(59) පහත සඳහන් ලක්ෂණ අතරෙන් එක් සත්ත්ව වංශයකට පමණක් සීමා වූ ලක්ෂණයක් නොවන්නේ,
(1) ඒකසෛලීය දේහ ආකාරය (2) ජලවාහිනී පද්ධතිය (3) රේත්‍රිකාව
(4) විවෘත සංසරණ පද්ධතිය (5) ග්‍රසනිත පැලුම් (1996- Z)

(60) පරම්පරා ප්‍රත්‍යාවර්තනය සාමාන්‍යයෙන් දක්නට ලැබෙනුයේ,
(1) Coelenterata වංශයේය. (2) Echinodermata වංශයේය.
(3) Mollusca වංශයේය. (4) Platyhelminthes වංශයේය.
(5) Nematoda වංශයේය. (1996- Z)

(61) පහත සඳහන් ලක්ෂණ අතරෙන් සියලුම ඇනලිඩා වර්ගවලට පොදු ලක්ෂණයක් වනුයේ කුමක්ද?
(1) ඒකස්තරීය අපිචර්මය (2) අංශපාදිකා (3) කැපී පෙනෙන හිස
(4) බීජකෝෂ (5) ට්‍රොකොපොර් කීටයා (1996- Z)

(62) පක්ෂ්ම නොදරන කීටයෙක් වනුයේ,
(1) ට්‍රොකොපොර් ය. (2) විලිජර් ය. (3) ප්ලනුලා ය.
(4) නෝප්ලියා ය. (5) ප්ලුටියස් ය. (1996- Z)

(63) සත්ත්ව වර්ගීකරණය සැමවිටම,
(1) පරිණාමික බන්ධුතා පෙන්නුම් කිරීමට උපකාරි වේ.
(2) සත්ත්වයන්ට ඔවුනට පමණක් සීමා වූ නාමයන් දීමට උපකාරී වේ.
(3) පුරෝකථන හැකියාව වැඩි දියුණු කිරීමට උපකාරී වේ.
(4) සම්ප්‍රභව ව්‍යුහ හඳුනා ගැනීමට උපකාරි වේ.
(5) විශේෂයන් හඳුනා ගැනීමට උපකාරි වේ. (1996- Z)

(64) පහත සඳහන් ඒවා අතරෙන් සියලු ම ආත්‍රොපොඩාවන්ට පොදු නොවන්නේ කුමක් ද?
(1) වැග්මීකරණය (2) පිටසැකිල්ල (3) රුධිර හෙබ
(4) ශ්වාසනාල (5) සන්ධි පාද (1997- Z)

(65) පහත සඳහන් ඒවා අතරෙන් කරදිය හා මිරිදිය වාසී ආකාර පමණක් අඩංගු වන සත්ත්ව කාණ්ඩය වනුයේ,
(1) සිලෙන්ටෙරාටාවන් ය. (2). සාකොඩිනාවන් ය. (3) එකිනොඩෙර්මියාවන් ය.
(4) හිරුඩිනෙයාවන් ය. (5) ක්‍රස්ටේසියාවන් ය. (1997- Z)

(66) පහත සඳහන් ඒවා අතරෙන් කෝඩාටාවන්ට පමණක් සීමා වූ ලක්ෂණයක් නොවනුයේ කුමක්ද?
(1) පෘෂ්ඨරජ්ජුව (2) අපර ගුද වලිගය (3) ග්‍රසනික පැලුම්
(4) සංවෘත රුධිර සංසරණ පද්ධතිය (5) උදරීය හෘදය (1997- Z)

(67) ආවේස් වර්ගය පිළිබඳ සත්‍ය නොවනුයේ පහත සඳහන් ඒවායින් කුමක් ද?
(1) පා ඇඟිලි පහක් තිබීම. (2) කවචමය බිත්තර තිබීම.
(3) දත් නොතිබීම (4) උර තලයෙහි නෞතලයක් තිබීම.
(5) වාත කෝෂ තිබීම (1997- Z)

(68) පහත දී ඇති කීට ආකාරවලින් එකක් ඊට ඉදිරියෙන් සඳහන් කර ඇති වංශයට අනුරූප නොවේ. මෙම කීට ආකාරය තෝරන්න.

| කීට ආකාරය | වංශය |
|---|---|
| (1) වෙලිජර් | මොලුස්කා |
| (2) ප්ලනුලා | සිලෙන්ටෙරාටා |
| (3) බයිපිනේරියා | එකයිනොඩෙර්මටා |
| (4) නෝප්ලියස් | ආත්‍රොපෝඩා |
| (5) ට්‍රොකොපොර් | නෙමටෝඩා |

(1998- Z)

(69) ඒකලිංගික ආකාර පමණක් අන්තර්ගත වනුයේ පහත සඳහන් කුමන සත්ත්ව කාණ්ඩයෙහිද?
(1) ඉන්සෙක්ටා (2) ට්‍රෙමටෝඩා (3) ගැස්ට්‍රොපෝඩා
(4) ඔලිගොකිටා (5) සෙස්ටෝඩා (1998- Z)

(70) පහත සඳහන් ඒවා අතුරෙන් ප්‍රොටොස්ටෝමියාවෙකු ඩියුටෙරොස්ටෝමියාවෙකුගෙන් වෙන්කර හඳුනා ගැනීම සඳහා භාවිත කළ නොහැක්කේ කුමක්ද?
(1) කීට ආකාරය (2) බ්ලාස්ටපිදුයට සාපේක්ෂ ව මුඛයේ ඇති වීම.
(3) ඩිම්බයේ ඇති බීජාන්න ප්‍රමාණය (4) භේදන රටාව
(5) සිලෝමය සෑදෙන ආකාරය (1998- Z)

(71) පහත සඳහන් ලක්ෂණ අතුරෙන් ක්‍රස්ටේසියාවෙකු කෘමියෙකුගෙන් වෙන්කර හඳුනා ගැනීම සඳහා භාවිත කළ නොහැක්කේ කුමක් ද?
(1) මැල්පිගිය නාලිකා නොතිබීම. (2) ස්පර්ශක යුගල් දෙකක් තිබීම.
(3) අත්ත්‍යයක් තිබීම. (4) පක්ෂ්ම නොතිබීම.
(5) හනුක ග්‍රන්ථි තිබීම. (1998- Z)

(72) උරගයින්ට සහ පක්ෂීන්ට පොදු ලක්ෂණයක් නොවනුයේ,
(1) ගාත්‍රා යුගල් දෙක ය. (2) වාත කෝෂ ය.
(3) කපාල ස්නායු යුගල දොළහ ය. (4) අපිචර්මීය කොරල ය.
(5) තනි අපරකපාල සන්ධාන අග්‍රයකින් යුත් හිස්කබල ය. (1998- Z)

(73) පහත සඳහන් ඒවා අතුරෙන් එක් වංශයකට පමණක් සීමා වූ ලක්ෂණයක් නොවනුයේ කුමක් ද?
(1) දංශක කෝෂ්ඨ (2) පෙඩිසෙලේරියා (3) වෘක්කිකා
(4) රේත්‍රිකාව (5). ඇහිතලය (1998- Z)

(74) පහත සඳහන් එක් ප්‍රතිචාරයක දක්වා ඇති ප්‍රධාන බහිස්‍රාවී ඵලය එය ඉදිරිපිට දී ඇති සත්ත්ව කාණ්ඩයට අදාළ නොවේ. මෙම ප්‍රතිචාරය තෝරන්න.

| සත්ත්ව කාණ්ඩය | ප්‍රධාන බහිස්‍රාවී ඵලය |
|---|---|
| (1) සිලෙන්ටෙරාටාවන් | ඇමෝනියා |
| (2) උභයජීවී කීටයන් | ඇමෝනියා |
| (3) උරගයින් | යූරියා |
| (4) ක්ෂීරපායින් | යූරියා |
| (5) පක්ෂීන් | යූරික් අම්ලය |

(1998- Z)

(75) ස්පර්ශක යුගල් දෙකක් ඇත්තේ,
(1) කෘමීන්ට ය. (2) ක්‍රස්ටාසෙයාවන්ට ය. (3) පත්තෑයන්ට ය
(4) මකුළුවන්ට ය. (5) හැකරැල්ලන්ට ය. (1999- Z)

(76) ජීවන චක්‍රයේ විලිජර් කීටයකු ඇතුළත් වී ඇත්තේ කුමන සත්ත්ව කාණ්ඩයට ද?
(1) සිලෙන්ටෙරාවන් (2) ඇනෙලිඩාවන් (3) මොලුස්කාවක්
(4) එකිනොඩෙර්මටාවන් (5) නෙමටෝඩාවන් (1999- Z)

(77) පහත සඳහන් භෝජන ක්‍රමවලින් එකක් එය ඉදිරිපිට සඳහන් කර ඇති සත්ත්ව කාණ්ඩයට අදාළ නොවේ. මෙම භෝජන ක්‍රමය තෝරන්න.

| භෝජන ක්‍රමය | සත්ත්ව කාණ්ඩය |
|---|---|
| (1) භක්ෂසෛලකතාව | ඇමීබාවන් |
| (2) පෙරා බුදීම | ස්විකපාටිකයින් |
| (3) විද උරා බීම | මදුරුවන් |
| (4) නොවිකා ගිල දැමීම | සර්පයන් |
| (5) හැපීම සහ විකීම | මකුණන් |

(1999- Z)

(78) පක්ෂීහු,
(1) ඔවුන්ගේ දේහ උෂ්ණත්වය යාමනය කරති.
(2) අපරකපාල සන්ධාන අග්‍ර දෙකක් සහිත හිස් කබල් දරති.
(3) ප්‍රධාන නයිට්‍රජනීය අපද්‍රව්‍ය ලෙස යූරියා බහිස්‍රාවය කරති
(4) ක්‍රියාකාරී ඩිම්බකෝෂ දෙකක් දරති.
(5) කොරපොතු නොදරති. (1999- Z)

(79) සෑම ඇනෙලිඩාවකුට ම,
(1) දෘඩි කෙඳි ඇත. (2) අංශපාදිකා ඇත. (3) මෙවුලක් ඇත.
(4) පැහැදිලි හිසක් ඇත. (5) වෘක්කිකා ඇත. (1999- Z)

(80) පරම්පරා ප්‍රත්‍යාවර්තනය දැකිය හැකි වංශය වනුයේ,
(1) එපිකොම්ප්ලෙක්සා ය. (2) සිලෙන්ටෙරාටා ය (3) මොලුස්කා ය.
(4) එකිනොඩෙර්මටා ය. (5) ආත්‍රොපෙඩා ය. (1999- Z)

(81) සෑම පෘෂ්ඨවංශිකයකුට ම නොමැත්තේ,
(1) කපාලයක් ය. (2) හනු ය. (3) මයිලිනීභූත ස්නායු තන්තු ය.
(4) ජලිහාවක් ය. (5) ආක්ෂක ඇටසැකිල්ලක් ය. (1999- Z)

(82) පහත සඳහන් ලක්ෂණ අතුරෙන් කොන්ඩ්‍රික්තියේස් වර්ගයේ සාමාජිකයින් අතර පමණක් දක්නට ලැබෙනුයේ කුමක් ද?
(1) රළු කොරල (2) කුටීර දෙකක් සහිත හෘදය (3) මධ්‍යවෘක්ක
(4) කපාල ස්නායු යුගල් දහයක් (5) ග්‍රසනික ජලක්ලෝම. (1999- Z)

(83) ආත්‍රොපොඩාවන්ගේ ශ්වසනය සම්බන්ධ නොවනුයේ,
(1) ජලක්ලෝම ය. (2) ශ්වාස රැක් ය (3) ශ්වාසනාල ය.
(4) දේහ පෘෂ්ඨය ය. (5) පත් පෙණහැලි ය. (1999- Z)

(84) පහත සඳහන් ඒවා අතුරෙන් ආත්‍රොපොඩා වංශයේ ආවේණික ලක්ෂණයක් නොවනුයේ කුමක් ද?
(1) උදරිය ස්නායු රජ්ජු යුගලයක් (2) පෘෂ්ඨීය හෘදයක් (3) සම්පූර්ණ ජීරණ පද්ධතිය
(4) නිර්විලිඛිත පේශි (5) කයිටිනීය පිටසැකිල්ල (1999- Z)

(85) පහත සඳහන් ඒවා අතරෙන් එක් වංශයකට පමණක් සීමා වූ ලක්ෂණයක් වනුයේ කුමක්ද?
(1) අභ්‍යන්තර සැකිල්ල (2) ට්‍රොකොපොර් කීටයා (3) බාහිර කවචය
(4) කොරල (5) මස්තිෂ්ක ගැංග්ලියම් ය. (2000- Z)

(86) මොලුස්කා වංශයට පමණක් සීමා වූ ලක්ෂණයක් වනුයේ
(1) ත්‍රි ප්‍රස්තරතාවය ය. (2) ට්‍රොකොපොර් කීටයා
(3) විවෘත රුධිර සංසරණ පද්ධතිය ය. (4) මෘදු දේහය ය.
(5) මස්තිෂ්ක ගැංග්ලියම් ය. (2000- Z)

(87) පෘෂ්ඨෝදරිය ව පැතලි ඛණ්ඩ සහිත දේහයක්, ස්පර්ශක යුගලක් සහ එක් එක් දේහ ඛණ්ඩයෙහි සන්ධි පාද යුගලක් දරණ සත්ත්වයකු වතුර වලක් අසල වූ ගලක් යට හමු විය. මෙම සත්ත්වයා
(1) ඩිප්ලොපොඩාවකු විය හැකි ය. (2) කිලොපොඩාවකු විය හැකි ය.
(3) ක්‍රස්ටේසියාවකු විය හැකි ය. (4) ඉන්සෙක්ටාවකු විය හැකි ය.
(5) අරැක්නිඩාවකු විය හැකි ය. (2000- Z)

(88) පහත සඳහන් ඒවා අතරෙන් ඩියුටෙරොස්ටෝමියා ලක්ෂණයක් වනුයේ කුමක් ද?
(1) පේදසිලෝමය (2) ට්‍රොකොපොර් කීටයා
(3) බ්ලාස්ටපිදුය මුඛය බවට පත්වීම (4) නිර්ණිත ඩිම්බය
(5) අරිය භේදනය (2000- Z)

(89) පහත සඳහන් එකිනොඩෙර්මටා වර්ග අතරෙන්, අසම්පූර්ණ ආහාර මාර්ගයක් සහිත සාමාජිකයන් අයත් වනුයේ කුමන වර්ගයට ද?
(1) ඇස්ටෙරොයිඩෙයා (2). ඔපියුරොයිඩෙයා (3) හොලොතුරොයිඩෙයා
(4) එකිනොයිඩෙයා (5). ක්‍රිනොයිඩෙයා (2000- Z)

(90) රෙප්ටිලියා, ආවේස් සහ මැමේලියා වර්ගවලට පොදු ආවේණික ලක්ෂණයක් වනුයේ
(1) කපාල ස්නායු යුගල 12 ක් තිබීම ය. (2) කුටීර 4ක් සහිත හෘදයක් තිබීම ය.
(3) සඟල ඩිම්බකෝෂ තිබීම ය. (4) අපර කපාල සන්ධාන අග්‍ර 2ක් තිබීම ය.
(5) දත් තිබීම ය. (2000- Z)

(91) පහත සඳහන් ඒවා අතරෙන් කෝඩාටා වංශයේ ආවේණික ලක්ෂණයක් නොවන්නේ කුමක් ද?
(1) පශ්ච ගුද වලිගය (2) උදරීය හෘදය (3) කශේරුව
(4) ග්‍රසනික ජලක්ලෝම පැලුම් (5) ආන්ත්‍රික සිලෝමය (2000- Z)

(92) පෘෂ්ඨවංශීන්ගේ ඇස්වලට බොහෝ දුරට සමාන ඇස් ඇත්තේ පහත දැක්වෙන කුමන සත්ත්ව කාණ්ඩයේ ද?
(1) ඇනලීඩාවන් (2) ආත්‍රොපෝඩාවන් (3) මොලස්කාවන්
(4) ප්ලැටිහෙල්මින්තයන් (5) එකයිනොඩර්මේටාවන් (2000)

(93) ක්ෂේත්‍ර අධ්‍යයනයකදී ශිෂ්‍යයෙක් මිරිදිය පොකුණක් තුළ කොරල රහිත සිනිඳු සමක් සහ යුගලමය ගාත්‍රා සහිත සතෙකු නිරීක්ෂණය කලේය මෙම සත්ත්වයා අයත්වීමට බොහෝ දුරට ඉඩ ඇත්තේ,
(1) Osteichthyes වර්ගයටය (2) Chondrichthyes වර්ගයටය (3) Amphibia වර්ගයටය
(4) Reptilia වර්ගයටය (5) Mammalia වර්ගයටය (2000)

(94) නෙමටෝඩාවෙක් ඇනලීඩාවෙකුගෙන් පහසුවෙන් වෙන් කර හඳුනාගත හැක්කේ,
1) සිලින්ඩරාකාර හෘදය නිසාය
2) ඛණ්ඩ රහිත දේහය නිසාය
3) චූෂකර නොතිබීම නිසාය
4) බාහිර ජලක්ලෝම නොතිබීම නිසාය
5) උපාංග නොතිබීම නිසාය (2000)

(95) Chordata වංශයට පරිණාමිකව වඩාත්ම බන්ධුතා දක්වන අපෘෂ්ඨවංශී වංශය වනුයේ,
(1) Arthropoda ය. (2) Annelida ය. (3) Echinodermato ය.
(4) Mollusca ය. (5) Platyhelminthes ය. (2001)

(96) සිසුන් කණ්ඩායමක් මිරිදිය හා භෞමික පරිසර පද්ධතිවල විශේෂ විවිධත්වය අධ්‍යයනය කර නිරීක්ෂණය කරන ලද ජීවීන් විවිධ තක්සෝනවලට කාණ්ඩ කරන ලදී. එම පරිසර පද්ධති දෙකෙහිම නිරීක්ෂණය කරනු ලැබීමට ඉඩ ඇත්තේ පහත දැක්වෙන කුමන තක්සෝනයට / තක්සෝන වලට අයත් ජීවීන්ද?
(A) Hirudinea (B) Insecta (C) Hydrozoa (D) Anthophyta (E) Bryophyta
(2001)

(97) පහත සඳහන් කුමන තක්සෝනයේ / තක්සෝනවල කරදිය ජීවීන් අන්තර්ගත වේද?
(1) Chlorophyta (2) Bryophyta (3) Chondrichthyes (4) Reptilia
(5) Lycophyta (2002)

(98) පහත දැක්වෙන වංශය/ ලක්ෂණය සංකලනයන් අතරෙන් වැරදි වන්නේ කුමක් ද?

| වංශය | ලක්ෂණය |
|---|---|
| (1) Pterophyta | කොරස දැරීම |
| (2) Byrophyta | මුල් දැරීම |
| (3) Cycadophyta | මහා බීජානු පත්‍ර දැරීම. |
| (4) Mollusca | උදරීය පාදයක් දැරීම. |
| (5) Echinodemata | අන්තඃසැකිල්ලක් දැරීම |

(2002)

(99) මිරිදිය පොකුණකින් අල්ලා ගන්නා ලද පරිණත සත්ත්වයෙක් පහත ලක්ෂණ දැරීය.
A) ජලක්ලෝම B) ඇස් දෙකක් C) චරපාද D) පෘෂ්ඨෝදරියව පැතලි දේහයක්
මෙම සත්ත්වයා බොහෝ දුරට අයත් වීමට ඉඩ ඇත්තේ පහත සඳහන් කුමන වර්ගයටද?
(1) Polychaeta (2) Insecta (3) Crustacea (4) Amphibia (5) Hirudinea
(2002)

(100) පරිණාමයේ දී ප්‍රකාශ ප්‍රතිග්‍රාහක විකසනය වූ ප්‍රථම සත්ත්ව කාණ්ඩය වන්නේ,
(1) සීලන්ටරේටාවන් ය. (2) පැතලි පණුවන් ය. (3) ඇනලීඩාවන් ය.
(4) ආත්‍රොපොඩාවන් ය. (5) මොලස්කාවන් ය. (2003)

(101) Chondrichtyes වර්ගයට අයත් සත්තු,
(A) රළු කොරල දරති.
(B) පිධානයක් නොදරති.
(C) සමාන ඛණ්ඩිකා දෙකක් සහිත වලිග වරල් දරති.
(D) අස්ථි වලින් සැකසුනු සැකිලි දරති.
(E) මිරිදිය වාසස්ථාන හා කරදිය වාසස්ථාන යන දෙකෙහිම ජීවත් වෙති (2003)

(102) ශ්‍රී ලංකාවේ මිරිදිය පොකුණුවල දක්නට නොලැබෙන්නේ පහත සඳහන් කුමන වර්ගීකරණ කාණ්ඩයට අයත් ජීවීන් ද?
(1) සයනොබැක්ටීරියා (2) නිඩාරියා (3) එකයිනොඩෙර්මාටා
(4) ක්ලොරොෆයිටා (5) මොලුස්කා (2005)

(103) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් පූර්ව ප්‍රසව මානව විකසනය පිළිබඳ ව නිවැරදි වනුයේ කුමක් ද?
(1) අධිරෝපණය සිදු වන්නේ මොරුලා අවධියේ දී ය.
(2) පෝෂබ්ලාස්ටය කලලාවාරය බවට විකසනය වේ.
(3) කලල බන්ධය සෑදී ඇත්තේ කෝරියමෙන් සහ අලින්ථයෙනි.
(4) ගර්භණී භාවයේ තුන්වැනි මාසය අවසානයේ දී භ්‍රෑණයේ බාහිර කන් විකසනය වී නොමැත.
(5) දරු උපත සිදු වීමට ආසන්නයේ දී කලල බන්ධය මගින් ප්‍රොජෙස්ටරෝන් නිපදවීම සීඝ්‍ර ලෙස අඩු වේ. (2006)

(104) මොනොකොටිලඩනේ වර්ගයේ ආවේණික ලක්ෂණයක් නො වන්නේ පහත සඳහන් ඒවායින් කුමක්ද?
(1) ආගන්තුක මුල් තිබීම (2) මුලේ මජ්ජාවක් නොතිබීම
(3) කඳේ සනාල කලාප විසරිතව තිබීම. (4) පුෂ්ප කොටස් තුනේ ගුණාකාර ලෙස තිබීම
(5) පත්‍රවල සමාන්තර නාරටි වින්‍යාසයක් තිබීම (2007)

(105) පහත සඳහන් සත්ත්ව කාණ්ඩ අතුරෙන් සරප්ජුකයන් සමග වඩාත්ම සමීප පරිණාමික බන්ධුතා දක්වන්නේ කුමන සත්ව කාණ්ඩයද?
(1) ඇනෙලීඩාවන් (2) නෙමටෝඩාවන් (3) මොලුස්කාවන්
(4) ආත්‍රොපෝඩාවන් (5) එකයිනොඩර්මේටාවන් (2007)

(106) ඔමැටිඩියා දක්නට ලැබෙනුයේ,
(1) පැතලි පණුවන්ගේ ය. (2) ඇනෙලීඩාවන්ගේ ය. (3) ආත්‍රොපෝඩාවන්ගේ ය.
(4) මොලස්කාවන්ගේ ය. (5) සීලන්ටරේටාවන්ගේ ය. (2007)

(107) පහත සඳහන් ප්‍රකාශ අතුරින් එකිනොයිඩියා වර්ගය පිළිබඳව නිවැරදි වන්නේ කුමන ප්‍රකාශය ද/ ප්‍රකාශ ද?
(A) ඔවුහු නාල පාද මගින් සංචරණය කරති.
(B) ඔවුහු පෙඩිසලේරියා දරති.
(C) ඔවුන්ගෙන් සමහරෙක් දිගු බාහු දරති
(D) ඔවුන්ගෙන් සමහරක් පැතලි මඬලාකාර දේහ දරති.
(E) ඔවුන්ගෙන් සමහරෙකුට ගුදයක් නොමැත. (2007)

(108) ඔෆියුරොයිඩාවන් අනෙක් එකයිනොඩර්මේටාවන්ගෙන් වෙනස් වන්නේ,
(1) පෙඩිසෙලේරියා දරන බැවිනි (2) ශ්වසන ගස් නොදරන බැවිනි
(3) ගුලිකා දරන බැවිනි (4) ගුදයක් නොදරන බැවිනි
(5) ග්‍රාහිකා දරන බැවිනි (2008)

(109) මෝරෙක් මඩුවෙකුගෙන් වෙනස් වන්නේ,
(1) ශ්වාසරන්ද්‍ර තිබීම හේතුවෙනි (2) උදරීය මුඛයක් තිබීම මගිනි.
(3) විසමාංශපුච්ඡ පෘෂ්ඨ වරලක් තිබීම මගිනි (4) පාර්ශ්වික ඇස් තිබීම මගිනි.
(5) උදරීය වරල් තිබීම මගිනි. (2008)

(110) පහත ලක්ෂණ අතුරෙන් කවරක් එකයිනොඩර්මේටා වංශයට පමණක් සීමා නොවේද?
(1) නාලපාද මගින් සංචරණය (2) චරණාර ප්‍රදේශ තිබීම
(3) ශ්වසන ගස් මගින් ශ්වසන කිරීම (4) ඩියුටෙරොස්ටොමිය විකසනය
(5) ජලවාහිනී පද්ධතියක් තිබීම (2009)

(111) වැසි දිනයක දී තම ගෙවත්තේ තෙත් පෘෂ්ඨයක් මත බඩගා යන පෘෂ්ඨෝදරීය ව පැතලි මෘදු දේහයක් සහිත සත්ත්වයෙක් ශිෂ්‍යයෙකු විසින් නිරීක්ෂණය කරන ලදි. මෙම සත්ත්වයාගේ නොතිබීමට ඉඩ ඇත්තේ පහත සඳහන් ඒවායින් කුමක් ද?
(1) වෘත්තාකාර පේශි (2) පක්ෂ්ම (3) ගුදය
(4) අන්වායාම ස්නායු රජ්ජු (5) බහිස්‍රාවී ප්‍රණාල (2010)

(112) A , B හා C ලෙස සලකුණු කරන ලද සතුන් තිදෙනෙකුගේ ලක්ෂණ කිහිපයක් පහත දක්වේ.

i) සතුන් තිදෙනාම ද්විපාර්ශ්වික සමමිතිය හා ශීර්ෂණය පෙන්නුම් කරයි

ii) A හා B ආහාර මාර්ග සම්පූර්ණ අතර , C ගේ ආහාර මාර්ගය අසම්පූර්ණ ය.

iii) ජලක්ලෝම හා පෘෂ්ඨීය හෘදයක් ඇත්තේ A ට හා B ට පමණි

iv) A ට පිටසැකිල්ලක්ද B ට ඇතුළු සැකිල්ලක්ද ඇති අතර C ට ඇතුළු හෝ පිට සැකිල්ලක් නොමැත.

A , B හා C ලෙස සලකුණු කරන ලද සතුන් තිදෙනා පිළිවෙලින්,

(1) ඉස්සා, දැල්ලා, හා පටිපණුවාය (2) ගොළුබෙල්ලා, තිලාපියා, හා ගැඩවිලා
(3) කැස්බෑවා, බලයා හා *Planaria* වේ (4) කකුළුවා, ගොලුබෙල්ලා, හා අක්මා පතැල්ලා
(5) ඉස්සා, මට්ටියා හා පටි පනුවා (2011)

(113) පහත ලක්ෂණ අතුරින් කවරක් අනෙලීඩා හා එකයිනොඩර්මටා යන කාණ්ඩ දෙකෙහිම දක්නට ලැබේද?

A) හොඳින් විකසනය වූ සිලෝමය B) වෘක්කිකා C) බාහිර සංසේචනය
D) ජලක්ලෝම E) කීට අවස්ථා F) ශීර්ෂණය

(1) B , D හා E පමණි (2) A, C හා D පමණි (3) A,C,D හා E පමණි
(4) A,C,D හා F පමණි (5) A හා E පමණි (2011)

(114) සෑම එකයිනොඩර්මේටාවෙකු තුළම දක්නට ලැබෙන්නේ පහත සඳහන් කුමන ව්‍යුහ ද?

(A) මධ්‍ය මඬල කණ්ටක, ශ්වසන ගස්
(B) බාහු, පෙඩිසලේරියා, ජම්බාලිය
(C) අරීය ස්නායු, සීලෝමය, ප්‍රජනනේද්‍රිය ප්‍රණාල
(D) නාල පාද, ඇතුළු සැකිල්ල, ජල වාහිනී පද්ධතිය
(E) ගුදය, අනුපක්ෂක අක්ෂි ලප (2012)

(115) සරප්ජුකයෙකුට පහත දැක්වෙන ලක්ෂණ ඇත.

a. බාහිර සංසේචනය b. කීට අවස්ථාව c. අණ්ඩජතාව d. ඇසිපිය

මෙම සත්ත්වයාගේ තිබිය හැකි අනිත් ලක්ෂණ වන්නේ,

(A) පාද, අචලතාපීතාව සහ කාටිලේජය
(B) කොරපොතු, චර්මීය ග්‍රන්ථි සහ වලිගය
(C) කුටීර තුනකින් යුත් හෘදය, මැද කන සහ අස්ථිමය සැකිල්ල
(D) දත්, කපාල ස්නායු යුගල් 10 සහ පෙනහැලි
(E) නිමීලන පටලය, බාහිර ශ්‍රවණ නාලය සහ රෝම (2012)

(116) මොලස්කා වංශයේ මෙන් ම ප්ලැටිහෙල්මින්තේස් වංශයේ ද දැකිය හැක්කේ පහත සඳහන් කුමන ව්‍යුහද?

(1) ගැංග්ලියා, ජලක්ලෝම, චූෂකර (2) ස්නායු රජ්ජු, බහිස්‍රාවී ප්‍රණාල, ගුදය
(3) ස්නායු වලය, අක්ෂි ලප, ශ්ලේෂමල ග්‍රන්ථි (4) රසායන ප්‍රතිග්‍රාහක, ග්‍රාහිකා, වෘක්කිකා
(5) තුලා කෝෂ්ඨ, අංකුශ, ප්‍රජනනේද්‍රිය ප්‍රණාල (2013)

(117) අචලතාපී සතුන් සහිත පෘෂ්ඨවංශී වර්ගවල ආවේණික ලක්ෂණ පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) අචලතාපී සතුන් සහිත සියලුම පෘෂ්ඨවංශී වර්ග ජලාබුජ සතුන් සහිත ය.
(2) අණ්ඩජලාබුජ සතුන් සහිත සියලුම පාෂ්ඨවංශී වර්ග අචලතාපී සතුන් සහිත ය.
(3) නිමීලන පටල දරන සතුන් සහිත සියලුම පාෂ්ඨවංශී වර්ග අචලතාපී සතුන් සහිත ය.
(4) අචලතාපී සතුන් සහිත සියලුම පෘෂ්ඨවංශී වර්ග කපාල, ස්නායු යුගල් 12 ක් දරන සතුන් සහිත ය.
(5) අභ්‍යන්තර සංසේචනය දක්වන සතුන් සහිත සියලුම පෘෂ්ඨවංශී වර්ග අචලතාපී සතුන් සහිත ය. (2013)

(118) චූෂකර දරන සතුන් අන්තර්ගත නොවන්නේ පහත සඳහන් කුමන වංශයේද?

(1) ප්ලැටිහෙල්මින්තේස් (2) ඇනලීඩා (3) නෙමටෝඩා
(4) මොලස්කා (5) එකයිනොඩර්මේටා (2014)

(119) අභ්‍යන්තර සංසේචනය නොදක්වන සතෙකු / සතුන් ඇතුළත් වන්නේ පහත සඳහන් කුමන කාණ්ඩයේද?
(1) Planaria, සමනලයා, ගොලුබෙල්ලා (2) මෝරා, Bipalium, ගෙමැස්සා
(3) කැරපොත්තා, ගල්මාළුවා, අක්මා පැතැල්ලා (4) Ichthyophis, පටිපණුවා, මදුරුවා
(5) ගිරවා, කුරා, මඩුවා (2014)

(120) මොලොස්කාවන් කිහිපදෙනෙක්, ඔවුන් දරන ව්‍යුහ කිහිපයක් සහ ඔවුන් ජීවත්වන පරිසර පහත වගුවේ දක්වේ.

| මොලස්කාවන් | ව්‍යුහ | පරිසර |
|---|---|---|
| A - මට්ටියා | a - ඇස් | i - කරදිය |
| B - ගොළුබෙල්ලා | b - ග්‍රාහිකා | ii - මිරිදිය |
| C - කාවාටියා | c - රේත්‍රිකාව | iii - භෞමික |
| D - දැල්ලා | d - බාහිර කවචය | |

පහත දැක්වෙන මොලස්කාවා - ව්‍යුහය - පරිසරය සංකලන අතුරෙන් නිවැරදි වන්නේ කුමන සංකලනයද?
(1) C a i (2) B b iii (3) A c ii (4) D d i (5) C b i (2014)

(121) A, B, C සහ D ලෙස නම් කරන ලද නිදර්ශකවල දක්නට ලැබෙන එක් බාහිර ලක්ෂණයක් බැගින් පහත දී ඇත.
A - පෘෂ්ඨීය වරල් දෙක
B - බඳ ප්‍රදේශයේ ඇති කළු පැහැති අන්වායාම පටි
C – දේහයේ එක් එක් පැත්තේ ඇති කහ පැහැති පටි
D - ගුද වරලෙන් වෙන් වූ බණ්ටක දෙක
A, B, C සහ D යන නිදර්ශක නිවැරදි අනුපිළිවෙලින්
(1) බලයා, පරවා, තෙල්ගොඩයා මඩුවා වේ.
(2) තෙල්ගොඩයා, බලයා, Ichthyophis සහ පරවා
(3) පරවා, මෝරා, තෙල්ගොඩයා සහ බලයා
(4) මෝරා, Ichthyophis, මඩුවා සහ තෙල්ගොඩයා
(5) පරවා, Ichthyophis, තෙල්ගොඩයා සහ මෝරා (2014)

(122) ඇනලිඩාවෙක් නෙමටෝඩාවෙකුගෙන් වෙන්කර හඳුනා ගැනීමට භාවිත කළ හැක්කේ පහත සඳහන් කුමන ලක්ෂණය ද?
(1) හොඳින් විකසනය වූ දේහ කුහරය (2) උච්චර්මය (3) දුවස්ථිති සැකිල්ල
(4) ප්‍රණාල සහිත ප්‍රජනේන්ද්‍රිය (5) මස්තිෂ්ක ගැංග්ලියා (2015)

(123) කෘමීන්ට සහ ඩිප්ලොපෝඩාවන්ට පොදු වනුයේ පහත සඳහන් කුමන ලක්ෂණය ද? / ලක්ෂණ ද?
(A) හිස, උරස සහ උදරය ලෙස බෙදුනු දේහය
(B) ස්පර්ශක යුගලක් තිබීම.
(C) උරසේ පාද යුගල තුනක් තිබීම.
(D) උදරයේ පාද නොමැති වීම.
(E) කයිටීන් සහ කැල්සියම් කාබනේට් සහිත පිටසැකිල්ලක් තිබීම. (2015)

(124) චලතාපී, අණ්ඩජ සහ කපාල ස්නායු යුගල 12ක් දරන සත්ත්ව කාණ්ඩය වනුයේ පහත සඳහන් ඒවායින් කුමක් ද?
(1) කොන්ඩ්‍රික්තියේස් (2) ඔස්ටෙයික්තියේස් (3) ඇම්ෆිබියා
(4) රෙප්ටිලියා (5) ආවේස් (2015)

(125) ග්ලයිකොජන් ප්‍රධාන සංචිත ආහාරය ලෙස ඇති ජීවීන් අයත් වන වංශ දෙකක් වන්නේ,
(1) කිට්‍රිඩියොමයිකෝටා සහ ලයිකොෆයිටා ය. (2) සයිගොමයිකෝටා සහ ටෙරොෆයිටා ය.
(3) කෝඩේටා සහ ක්‍රිසෝෆීටා ය. (4) සයිකැඩොෆයිටා සහ ෆියෝෆීටා ය.
(5) බැසීඩියොමයිකෝටා සහ ඇස්කොමයිකෝටා ය. (2016)

(126) ස්පර්ශක යුගලක් සහ දේහයේ සෑම ඛණ්ඩයකම උපාංග යුගලක් දරන සතෙක් ශිෂ්‍යයෙකු විසින් නිරීක්ෂණය කරන ලදී. එම සත්ත්වයා අයත් වන්නේ පහත සඳහන් කුමන වර්ගයට ද?

(1) ක්‍රස්ටේශියා (2) කයිලොපෝඩා (3) ඩිප්ලොපෝඩා
(4) ඉන්සෙක්ටා (5) ඇරක්නිඩා (2016)

(127) කෝඩේටාවන් සහ මොලස්කාවන් යන කාණ්ඩ දෙකෙහිම දක්නට ලැබෙන්නේ පහත සඳහන් කුමන ලක්ෂණය ද? / ලක්ෂණ ද?

(A) ඇතුළු සැකිල්ල (B) ජලක්ලෝම (C) අභ්‍යන්තර සංසේචනය
(D) හොඳින් විකසනය වූ ඇස් (E) ජේත්‍රිකාව (2016)

(128) අභ්‍යන්තර සංසේචනය තිබීම, ස්නායු වලයක් තිබීම සහ කීට අවස්ථාවක් නොමැති වීම පහත සඳහන් කුමන සත්ත්වයාගේ ලක්ෂණ ද?

1) *Arenicola* 2) *Oecophylla* 3) ගැඩවිලා 4) *Bipalium* 5) මකුළුවා (2017)

(129) ගෝනුස්සා, හැකරැල්ලා, කැරපොත්තා, ඉස්සා සහ පත්තෑයා එකිනෙකාගෙන් වෙන් කර ගැනීම සඳහා ප්‍රායෝගික පංතියේදී දෙබෙදුම් සූචියක් සෑදීමේදී අවම වශයෙන් ප්‍රයෝජනවත් විය හැක්කේ පහත සඳහන් කවර ඒවායින් කුමක් ද?

1) පිටසැකිල්ල 2) ස්පර්ශක 3) ඇස් 4) පියාපත් 5) පාද (2017)

(130) ග්‍රාහිකා දරන, උදරීය හෘදයක් නොදරන, ද්විපාර්ශ්වික සමමිතික සීලෝමික සතෙකුට තිබිය හැක්කේ පහත සඳහන් ඒවායින් කුමක් ද?

1) කණ්ටක 2) ස්නායු වලය 3) ස්පර්ශක 4) ජලක්ලෝම 5) අනුපක්ෂක (2018)

(131) ප්‍රධාන බහිස්‍රාවී ද්‍රව්‍යය යූරියා වන චලතාපී සතෙකු පහත සඳහන් කමන ව්‍යුහය / ව්‍යුහ දැරිය හැකි ද?

A) ජලක්ලෝම B) කුටීර හතරක් සහිත හෘදය C) ගෙල
D) පෙනහැලි E) හොට (2018)

## පිළිතුරු

### 3. 1. 1 : පරිණාමය විස්තර කරන වාදයන්

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | 4 | (2) | 2 | (3) | 3 | (4) | 5 | (5) | 5 | (6) | 1 | (7) | 3 |
| (8) | 4 | (9) | 5 | (10) | 3 | (11) | 5 | (12) | 5 | (13) | 5 | (14) | 5 |
| (15) | 4 | (16) | 4 | (17) | 3 | (18) | 2 | (19) | 2 | (20) | 4 | | |

### 3. 2. 1 : විද්‍යාත්මක පදනමක් මත තක්සෝන ධූරාවලිය ගොඩ නගයි.

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | 3 | (2) | 4 | (3) | 3 | (4) | 4 | (5) | 4 | (6) | 3 |
| (7) | 1 | (8) | 4 | (9) | 5 | (10) | 4 | (11) | 4 | (12) | 3 |
| (13) | 1 | (14) | 5 | (15) | 4 | (16) | 2 | (17) | 5 | (18) | 5 |
| (19) | 3 | (20) | 1 | (21) | 1 | (22) | 3 | (23) | 1 | (24) | 2 |

**වෛරස**

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | 1 | (2) | 4 | (3) | 2 | (4) | 4 | (5) | 3 | (6) | 4 |
| (7) | 3 | (8) | 4 | (9) | 1, 2 | (10) | 4 | (11) | 5 | | |

### 3. 2. 2 : බැක්ටීරියා සහ සයනොබැක්ටීරියා

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | 5 | (2) | 5 | (3) | 4 | (4) | 2, 5 | (5) | 4 | (6) | 3 |
| (7) | 2 | (8) | 4 | (9) | all | (10) | 1 | (11) | 3 | (12) | 2 |
| (13) | 2 | (14) | 4 | (15) | 1 | (16) | 2, 1 | (17) | 4 | (18) | 5 |
| (19) | 2 | (20) | 5 | (21) | 5 | (22) | 3 | | | | |

### 3. 2. 3 : ප්‍රොටිස්ටා රාජධානිය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | 3 | (2) | 3, 5 | (3) | 2 | (4) | 5 | (5) | 4 | (6) | 5 |
| (7) | 1 | (8) | 1 | (9) | 5 | (10) | 4 | (11) | 4 | (12) | 4 |
| (13) | 5 | (14) | 5 | (15) | 3 | (16) | 3 | | | | |

### 3. 2. 4 ශාක රාජධානිය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | 5 | (2) | 1 | (3) | 1 | (4) | 3 | (5) | 4 | (6) | 1 |
| (7) | 4 | (8) | 3 | (9) | 5 | (10) | 5 | (11) | 5 | (12) | 5 |
| (13) | 3 | (14) | 5 | (15) | 1 | (16) | 4 | (17) | 4 | (18) | 1 |
| (19) | 3 | (20) | 3 | (21) | 5 | (22) | 5 | (23) | 5 | (24) | 4 |
| (25) | 3 | (26) | 5 | (27) | 2 | (28) | 5 | (29) | 2 | (30) | 5 |
| (31) | 2 | (32) | 2 | (33) | 4 | (34) | 4 | | | | |

### 3. 2. 5 දිලීර

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | 3 | (2) | 1 | (3) | 1 | (4) | 2 | (5) | 5 | (6) | 5 |
| (7) | 4 | (8) | 4 | (9) | 4 | (10) | 3 | (11) | 1 | (12) | 2 |
| (13) | 4, 5 | (14) | 4 | (15) | 5 | (16) | 4 | (17) | 4 | (18) | 3 |
| (19) | 3 | (20) | 5 | (21) | 3 | (22) | 4 | (23) | 3 | (24) | 5 |
| (25) | 2 | | | | | | | | | | |

### 3. 2. 6 : සත්ත්ව රාජධානිය

### බාහිර ලක්ෂණ අනුව ජීවීන් වර්ග හඳුනා ගැනීම

### 3. 2. 7 : කෝඩේටා වංශය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | 3 | (2) | 5 | (3) | 5 | (4) | 1 | (5) | 4. | (6) | 2 |
| (7) | 4 | (8) | 2 | (9) | 3 | (10) | 3 | (11) | 3 | (12) | all |
| (13) | 2 | (14) | 1 | (15) | 2 | (16) | 2 | (17) | 5 | (18) | 5 |
| (19) | all | (20) | 1 | (21) | 4 | (22) | 3 | (23) | 2 | (24) | 4 |
| (25) | 2 | (26) | 4 | (27) | 1 | (28) | 5 | (29) | 2 | (30) | 4 |
| (31) | 4 | (32) | 5 | (33) | 2 | (34) | 4 | (35) | 5 | (36) | 2 |
| (37) | 5 | (38) | 2 | (39) | 5 | (40) | 4 | (41) | 3 | (42) | 5 |
| (43) | 2 | (44) | 5 | (45) | 1 | (46) | 1 | (47) | 1 | (48) | 3 |
| (49) | 2 | (50) | 5 | (51) | 2 | (52) | 3 | (53) | 1 | (54) | 4 |
| (55) | 2 | (56) | 2 | (57) | 4 | (58) | 2 | (59) | 4 | (60) | 1 |
| (61) | 1 | (62) | 4 | (63) | 3 | (64) | 4 | (65) | 1 | (66) | 4 |
| (67) | 1 | (68) | 5 | (69) | 1 | (70) | 3 | (71) | 4 | (72) | 2 |
| (73) | 3 | (74) | 3 | (75) | 2 | (76) | 3 | (77) | 5 | (78) | 1 |
| (79) | 5 | (80) | 2 | (81) | 2 | (82) | 1 | (83) | 2 | (84) | 4 |
| (85) | | (86) | | (87) | | (88) | | (89) | | (90) | |
| (91) | | (92) | | (93) | 3 | (94) | 2 | (95) | 3 | (96) | 1 |
| (97) | 2 | (98) | 2 | (99) | 3 | (100) | 1 | (101) | 3 | (102) | 3 |
| (103) | 5 | (104) | 2 | (105) | 5 | (106) | 3 | (107) | 1 | (108) | 4 |
| (109) | 4 | (110) | 4 | (111) | 3 | (112) | all | (113) | 3 | (114) | 4 |
| (115) | 4 | (116) | 3 | (117) | 4 | (118) | 3 | (119) | 3 | (120) | 2 |
| (121) | 2 | (122) | 1, 5 | (123) | 3 | (124) | 4 | (125) | 5 | (126) | 2 |
| (127) | 5 | (128) | 4 | (129) | 1 | (130) | 4 | (131) | 5 | | |

# ජීව විද්‍යාව

# BIOLOGY

## Advanced Level

## උසස් පෙළ

## 1985-2018

පසුගිය විභාග ප්‍රශ්න

Classified

**MCQ**

වර්ගීකරණය කළ

**බහුවරණ**

**3 ඒකකය**

**පරිණාමය හා ජීවීන්ගේ විවිධත්වය**


**සී/ස පේසුරු ප්‍රකාශන පුද්**

330ඩී, ජයන්ති මාවත,
දේවමිත්ත පෙදෙස, හෙයියන්තුඩුව.

අලෙවිසැල
779/1, මිල්ලගහ වත්ත පාර, මාළඹේ.

**pesuru**
Prakashana Private Ltd.

**Head Office**
330 D, Jayanthi Mawatha,
Dewamiththa Place, Heiyanthuduwa.

**Sales Office**
779/1, Millagaha Watta Rd, Malabe.

Tel: 0112487218
E Mail: pesuru@gmail.com

**www.pesuru.com**